ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No. } HRC 1349/18

දිනය / திகதி / Date } 2022.02.03

පැමිණිලි පාර්ශවය : කේ.ඩී.සරත් විජේරත්න මයා.
30/90 සී. ලොන්ඩන් පෙදෙස.
කොළඹ 07.

වගඋත්තරපාර්ශවය :

01. ප්‍ර.පො.ප. ප්‍රසන්න වැලිකල මයා.
මූලස්ථාන පොලිස් පරීක්ෂක.
පොලිස් ස්ථානය.
හොරණ.

02. අධ්‍යක්ෂ ජනරාල්.
මධ්‍යම පරිසර අධිකාරිය.
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත.
බත්තරමුල්ල.

03. කම්කරු කොමසාරිස් ජනරාල්.
කම්කරු දෙපාර්තමේන්තුව.
නාරාහේන්පිට. කොළඹ 05.

04. මහජන සෞඛ්‍ය පරීක්ෂක.
මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය.
මුදුරාවල.

**පැමිණිලි අංකය : එච්.ආර්.සී/1349/18**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :**

පැමිණිලිකරු තම පැමිණිල්ල තුලින් දක්වා ඇත්තේ, හොරණ බැල්ලපිටිය, කළවැල්ලාව පාර යන ස්ථානයේ පිහිටි එස් ඇන්ඩ් සී ලේටෙක්ස් පෞද්ගලික කර්මාන්ත ශාලාවේ හිමිකරු තමා බව ද එකී කර්මාන්ත




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / E-mail | sechrc@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

ශාලාව රබර් ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලියක යෙදෙන බව ද එහි ප්‍රධාන අධ්‍යක්ෂවරයා තමා බව ද ය. 2018.04.19 වන දින මෙම කර්මාන්ත ශාලාව තුළ සිදුවූ හදිසි අනතුරක් හේතුවෙන් විමර්ශන සිදු කිරීමේදී වගඋත්තකරුවන් කටයුතු කර ඇති ආකාරය අනුව පැමිණිලිකරු කර්මාන්ත ශාලා හිමිකරු වන තමාගේ ද තම පවුලේ සාමාජිකයින්ගේ ද මෙම කර්මාන්ත ශාලාවේ සේවය කරන නිලධාරීන් දෙදෙනෙකු වන අමුගොඩ කංකානමගේ දොන් රත්නසිරි එදිරිසිංහ මහතා සහ ඉනෝකා සංජීවනී වැලිකල යන අයගේද මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවය. වගඋත්තරකරුවන්ගේ පරිපාලන හා විධායක ක්‍රියාවන් හේතුවෙන් තමා ඇතුළු ඉහත නම් කළ පාර්ශවයන්ගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බව පෙන්වා දෙමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කළ තම පැමිණිල්ල විභාගයට ගෙන මූලික අයිතිවාසිකම් කඩවූ බවට නිර්දේශයක් ද ඉල්ලා ඇති සහන ලබා දෙන ලෙසට ද දක්වා තිබේ.

පැමිණිල්ල තුළින් වැඩිදුරටත් දක්වා ඇත්තේ, මෙම කර්මාන්ත ශාලාවේ අප ජලය බැහැර කරන භූගත ටැංකියක කරාමයක් වැසීමට කටයුතු කළ සේවකයකු අපරීක්ෂාකාරී ලෙස තම කටයුතු සිදු කිරීමෙන් එම ටැංකියට වැටී තිබීම ද ඔහු බේරා ගැනීමට යාමෙන් තවත් සේවකයෙකු හා අසල්වැසි පදිංචි කරුවන් කිහිප දෙනෙකු වැටී මිය යාම ද මෙම ගැටළු සහගත තත්ත්වය ඇති වීමට හේතුව වී ඇති බව ය.

අප දියර බැහැර කරන ටැංකියට අදාළව පරිසර අධිකාරිය විසින් අනුමත කළ කොන්දේසි ප්‍රකාරව වසර 23 ක පමණ කාලයක් ආයතනය කටයුතු කරගෙන ආ බව ද ආරක්ෂක ක්‍රමවේද පිළිපැදීමකින් තොරව අනාරක්ෂිත ලෙස එක් සේවකයෙකු කටයුතු කිරීමට යාමෙන් මෙම අනතුර සිදුව ඇති බව ද පෙන්වා දී තිබේ.

මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් හේමන්ත ජයසිංහ මහතා ප්‍රමුඛ නිලධාරීන් විසින් මෙම හදිසි අනතුර මත උද්ගත වූ කරුණු පිළිබඳ නිසි ලෙස සොයා බැලීමකින් තොරව මෙම කර්මාන්ත ශාලාවේ පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අසාධාරණ ලෙස අත්හිටුවන ලද බව ද දේශපාලනික බලපෑම් මත හා ද්වේෂ සහගත හේතූන් පදනම් කරගෙන මධ්‍යම පරිසර අධිකාරිය එසේ කටයුතු කළ බව ද එසේම හොරණ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ප්‍රසන්න වැලිකල මහතා ද පො.ප. ඉන්දික, පො.ප.නලින් දර්ශන, පො.ප. යූ.ඩී.රුවන් ඉන්දික, උ.පො.ප. දයානන්ද යන නිලධාරීන් එක්ව ද්වේශ සහගතව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමක් සිදුව ඇති බව ද සාවද්‍ය ලෙස කරුණු අධිකරණයට දක්වා නඩු පැවරීමෙන් මානසික හිංසනයක් සිදුවන ආකාරයට කටයුතු කළ බව ද පැමිණිල්ල හා ඊට අදාලව පරීක්ෂණ සිදුවන අවස්ථා වලදී ඉදිරිපත් කළ ලේඛන තුළින් දක්වා තිබේ. එමෙන්ම මදුරාවල ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී එරන්දති කුලරත්න මිය විසින් ද කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වරයා සහ තවත් නිලධාරීන් විසින් ද මෙම කර්මාන්ත ශාලාවේ අනතුර සිදුවීමෙන් අනතුරුව ක්‍රියා කර ඇති ආකාරය අනුව ද දැඩි අසාධාරණයක් සිදුවූ බව පැමිණිල්ල සහ ඊට අමුණා ඇති සවිස්තරාත්මක කරුණු සහිත ලේඛන තුළින් දක්වා තිබේ. තම කර්මාන්ත ශාලාවේ නිලධාරීන් අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීමට හොරණ පොලිසියේ එවකට කටයුතු කළ මූලස්ථාන පොලිස් පරීක්ෂක, ප්‍ර.පො.ප. ප්‍රසන්න වැලිකල මයා විසින් ක්‍රියා කරන ලද බව ද තමා ද නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීමට තැත් කිරීමට ඔහු කටයුතු කළ බව පැමිණිල්ල තුළින් වැඩිදුරටත් දක්වා තිබේ. යම් කර්මාන්ත ශාලාවක හදිසි අනතුරක් සිදුවූ විට අනුගමනය කළයුතු නීතිමය ක්‍රමවේද වලට පරිබාහිරව වගඋත්තරකරුවන් කටයුතු කළ බව ද පැමිණිල්ල තුළින් දක්වා තිබේ.

ප්‍රසිද්ධ මාධ්‍ය මගින් සාවද්‍ය තොරතුරු ප්‍රචාරය කරමින් මදුරාවල ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනිය සහ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කර තිබීම පිළිබඳව ද පැමිණිල්ල තුළින් හා වැඩිදුරටත් කරුණු දක්වා ඉදිරිපත් කරන ලද ලේඛන තුළින් පෙන්වා දී ඇති අතර ඉන් තමාට හා කර්මාන්ත ශාලාවට සිදුවී ඇති අගතිය මත ද තමා දැඩි හිංසනයකට ලක් වූ බව පෙන්වා දී තිබේ. නීතිය ඉදිරියේ ඇති සමානාත්මතාවයේ අයිතිවාසිකම හා සර්ව සාධාරණත්වයේ හිමිකම අහිමි කරමින් වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බව ද තම මූලික අයිතිවාසිකම් කඩ වන ආකාරයට කළ එකී ක්‍රියාවන්ට එරෙහිව පරීක්ෂණ කටයුතු සිදු කර ඉල්ලා ඇති සහන සහ තවදුරටත් සුදුසු සහන ලබාදෙමින් නිර්දේශයක් ද ලබාදෙන ලෙස පැමිණිලිකරු ඉල්ලා සිටී.

තවද පැමිණිලිකරු විසින් තම පැමිණිල්ල ගොනු කිරීමෙන් අනතුරුව වරින් වර පැමිණිල්ලේ කරුණු පිළිබඳ සවිස්තරාත්මකව පැහැදිලි කිරීම් සිදු කරමින් ලේඛන ඉදිරිපත් කර ඇති අතර ඉන් වැඩිදුරටත් දක්වා ඇත්තේ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට හොරණ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් දිගින් දිගටම කටයුතු කළ ආකාරය ද තමා හොරණ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වූ පසු මහේස්ත්‍රාත් වරයා විසින් තමා ඉදිරිපත් කළ කරුණු වෙත සාධාරණ සවන් දීමක් සිදු නොකර තමා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට පියවර ගත් බව ද ව්‍යාපාර හිමිකරුවෙකු ලෙස ඇතිකර ගත් කීර්ති නාමය පිළිබඳව ද නොසලකා හරිමින් කළ රක්ෂිත බන්ධනාගාර ගත කිරීම හේතුවෙන් දෙවන වරට ද තමා මෙන්ම තම කර්මාන්ත ශාලාවේ නාමයට ද අසීමිත හානියක් වූ බව ය. එමෙන්ම කරුණු සොයා බැලීමකින් තොරව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු වෙනුවෙන් කටයුතු කළ නිලධාරීන් විසින් සාවද්‍ය කරුණු මාධ්‍යයට ඉදිරිපත් කිරීමෙන් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් ඔවුන් ක්‍රියා කර නැවතත් තමාට එරෙහිව ක්‍රියාවන් සිදු කර ඇති බව ද දක්වා තිබේ.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් තම විෂය පථයට අදාළ නොවන කටයුතු වලට මැදිහත් වීමෙන් කර්මාන්ත ශාලාවේ පාරිසරික බලපත්‍රය අනීතික ලෙස අවලංගු කළ බවද ඉන් කර්මාන්ත ශාලාව වසා තැබීමට සිදුවූ බවද ඉන් රුපියල් මිලියන ගණනාවක හානියක් තමාට සිදු කළ බව ද බොහෝ සේවකයින් පිරිසකට රැකියා කිරීමට ඇති අයිතිවාසිකම ඉන් තාවකාලිකව හෝ අහිමි වූ බව ද පෙන්වා දී තිබේ.

මෙකී සියළුම ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලිකරු මෙන්ම පැමිණිලිකරුගේ පවුලේ සියළු සාමාජිකයින් ද දැඩි මානසික කම්පනයකට ලක්ව සිටි බව ද දක්වා තම පැමිණිල්ල තුළින් දක්වා ඇති කරුණු වෙත අවධානය යොමු කර ඉල්ලා ඇති සහන ලබා දෙන ලෙස දක්වා තිබේ.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :**

2018.08.06 වන දින හොරණ පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රසන්න වැලිකල මයා විසින් තම කරුණු ලිඛිතව ලබාදී තිබේ.

එහි දක්වා ඇත්තේ 2018.04.19 වන දින පැය 14.00ට පොලිස් ස්ථානය වෙත යූඩීආර්14168 (මැදිරි 3) යටතේ ලත් පණිවිඩය පරිදි හොරණ පොලිස් වසමේ පිහිටි බැල්ලපිටිය ප්‍රදේශයට අයත් එස් ඇන්ඩ් සී ලේටෙක්ස් නම් වූ රබර් කර්මාන්ත ශාලාවේ අප ජලය බැහැර කරන ඇමෝනියා වළ නමින් හඳුන්වන

වළකට කර්මාන්ත ශාලාවේ සේවය කරන කිහිප දෙනෙකු වැටී ඇති බවට ලද තොරතුරක් මත නිලධාරීන් කණ්ඩායමක් සමග සිද්ධිය වූ ස්ථානයට ගොස් පරීක්ෂණ පැවැත්වූ බවය. තවද එම ස්ථානයට යන අවස්ථාවේදී කර්මාන්ත ශාලාවේ අප ජලය හා රසායනික ජලය එක්රැස් වන වළකට සේවකයින් දෙදෙනෙකු හා ආපදාවට ලක් වූ පුද්ගලයින් මුදා ගැනීමට පැමිණි ගම්වැසියන් තිදෙනෙකු අපද්‍රව්‍ය ටැංකියෙන් වහනය වූ විෂ වායුව ආඝ්‍රාහණය වීමෙන් හොරණ රෝහලට ඇතුලත් කර ඇති බව ද පසුව මිය ගොස් ඇති බවට ද කරුණු අනාවරණය වූ බව පෙන්වා දී තිබේ. කම්හලේ සේවකයින් හා ආපදාවට ලක් වූ පුද්ගලයින් මුදා ගැනීමට පැමිණි පුද්ගලයින් ද 1990 ගිලන් රථ සේවය මගින් විෂ වායුව ආඝ්‍රාහණය වීම මත රෝහල් ගත කර ඇති බව ද දැන ගන්නට ලද බව ද ප්‍රකාශ කර තිබේ. එම අවස්ථාවේදීම හොරණ මහේස්ත්‍රාත් අධිකරණය වෙත අංක : 34964/2018 යටතේ කරුණු වාර්තා කර සිද්ධිය වූ ස්ථානයට අදාළව මහේස්ත්‍රාත් පරීක්ෂණයක් ද පවත්වා මියගිය පුද්ගලයින් සම්බන්ධව පශ්චාත් මරණ පරීක්ෂණයක් ද සිදු කළ පසු මෘත දේහ සම්බන්ධව ක්‍රියා කිරීමට නියෝග ලබාගන්නා ලද බව ද ඉන් දක්වා තිබේ.

සිද්ධිය සිදුවන අවස්ථාවේදී කර්මාන්ත ශාලාවේ හිමිකරු වන කේ.ඩී.සරත් විජේරත්න යන අය කර්මාන්ත ශාලාව තුළ රැඳී සිට සිද්ධිය සිදුවනවාත් සමගම කර්මාන්ත ශාලාවෙන් පලාගොස් ඇති බවත් මෙම අපද්‍රව්‍ය රැඳී ඇති ටැංකිය තුළට එහි සේවකයින් යොමු කර ඇත්තේ අප ජලය පිටවන කරාමය වැසීමට බව ද එය ආයතනයේ ජ්‍යෙෂ්ඨ රසායනාගාර පාලිකාව වන ඉනෝකා සජීවනී වැලිකඩ යන අය විසින් කර ඇති බව ද එම අවස්ථාවේදී ආයතනයේ අධ්‍යක්ෂක, පරිපාලන හා කළමණාකරු ලෙස කටයුතු කර ඇත්තේ අමුගොඩ කංකානමගේ දොන් රත්නසිරි එදිරිසිංහ යන අය බව ද පෙන්වා දී තිබේ.

මෙම හදිසි තත්ත්වය හේතුවෙන් ප්‍රදේශයේ මහජනතාව අධික ලෙස කුපිතව කළහකාරී ලෙස මහජන සාමය කඩ වන ආකාරයට ක්‍රියා කරමින් කර්මාන්ත ශාලාව හා එහි දේපළ වලට හානි සිදු කිරීමට සූදානම් වූ බව පෙනී ගිය හෙයින් පොලිස් විශේෂ කාර්ය බලකාය සහ තවත් විශේෂ පොලිස් කණ්ඩායම් යොදවා කර්මාන්ත ශාලාවේ සහ ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කළ බව ද සිද්ධිය සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීමට රජයේ රස පරීක්ෂකට ද කම්කරු දෙපාර්තමේන්තුවට ද මධ්‍යම පරිසර අධිකාරියට ද මදුරාවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ද ඇතුළු තවත් ආයතන වෙත දැනුවත් කිරීම් සිදු කළ බව ද තම වාර්තාවෙන් දක්වා තිබේ.

2018.04.19 දින මෙම කර්මාන්ත ශාලාවේ අධ්‍යක්ෂ පරිපාලන හා කළමණාකරු ලෙස කටයුතු කළ ඉහත කී රත්නසිරි එදිරිසිංහ යන අය ද 2018.04.20 දින ආයතනයේ ජ්‍යෙෂ්ඨ රසායනාගාර පාලිකාව වන ඉනෝකා සජීවනී වැලිකල යන අය ද ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තිය හා 277, 328 හා 239 යන වගන්ති යටතේ වරද කියා දී අත්අඩංගුවට ගෙන ඉහත කී නඩු අංකය යටතේ හොරණ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බව ද දක්වා තිබේ. පසුව ආයතනයේ හිමිකරු වන මෙම පැමිණිල්ලේ පැමිණිලිකාර කේ.ඩී.සරත් විජේරත්න යන අය අධිකරණය වෙත ඉදිරිපත් වූ බව ද මහේස්ත්‍රාත් වරයා විසින් සැකකරුවන් රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කර තිබූ බව ද තම කරුණු ලෙස දක්වා තිබේ.

2019.05.28 දින කම්කරු දෙපාර්තමේන්තුවේ කළුතර දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු ලෙස කටයුතු කරන ටී.පී.ආර්.කේ.ප්‍රේමචන්ද්‍ර මහතා විසින් තම වාර්තාව ලබාදෙමින් පහත කරුණු දක්වා තිබේ.

හොරණ, බැල්ලපිටිය, කළුවැල්ලාව පාර යන ස්ථානයේ පිහිටි එස්.ඇන්ඩ් සී. ලේටෙක්ස් කර්මාන්ත ශාලාව තුළ සිදු වූ අනතුර සම්බන්ධව සම්පූර්ණ පරීක්ෂණයක් ඔහු විසින් සිදු කර එකී වාර්තාව දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ලබාදුන් බව ප්‍රකාශ කර තිබේ. මෙම පරීක්ෂණ සිදු කිරීමේදී කම්කරු දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් සහ පුද්ගලයින් වරින් වර විවිධ අවස්ථා වලදී කර්මාන්ත ඉංජිනේරු ලෙස තමා කළ පරීක්ෂණ කටයුතු සම්බන්ධව බලපෑම් සිදු කළ බව ද කර්මාන්ත ශාලාවට අගතියක් සිදු වන ආකාරයට කටයුතු කරන ලෙස ද නැති නම් එම නිලධාරීන් පවසන ආකාරයට කටයුතු නොකිරීමේ හේතුව මත දෙපාර්තමේන්තුවෙන් ඉවත් වී යන ලෙස ද තමා හට පැවසූ බව ද දක්වා තිබේ.

එමෙන්ම මෙම පරීක්ෂණයට විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු වරුන්ගෙන් සමන්විත කමිටුවක සහයෝගය ලබාදෙන ලෙස ලිඛිතව ඉල්ලා සිටියද ඊට කිසිදු සහයෝගයක් නොලද බව ද වැඩිදුරටත් ඔහු විසින් පෙන්වා දී තිබේ.

මෙම පරීක්ෂණ සම්බන්ධව නිකුත් කළ වැදගත් වාර්තා කිහිපයක් කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නීති නිලධාරී මගින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ද යොමු කර තිබියදී දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් ඊට ද එරෙහිව කර්මාන්ත ශාලා ඉංජිනේරු වන තමාට එරෙහිව ද්වේෂ සහගතව කටයුතු කිරීම සම්බන්ධව ලිඛිතව අවස්ථා කිහිපයකදී දක්වා තිබූ බව ද තමා අපක්ෂපාතී සාධාරණ පරීක්ෂණයක් සිදු කළ බව ද දක්වා තිබේ. තවද කර්මාන්ත ශාලාවට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හැකි වන පරිදි අසත්‍ය වාර්තා සකස් කර කර්මාන්ත ශාලාවේ ලිපිගොනුවට ඇතුලත් කරන ලෙස ද කම්කරු දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් විසින් දුරකථන මගින් දන්වා තිබූ බවද එකී හඬ පටය කොමිෂන් සභාවට ලබාදී ඇති බව ද වාර්තා කර තිබේ. ඔහුට එරෙහිව කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් හෝ යම් පාර්ශවයක් විසින් හෝ අයුක්ති සහගත ලෙස කටයුතු කරමින් ක්‍රියා කළහොත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීමක් ඔහු වෙනුවෙන් ද මැදිහත්ව කටයුතු කරන ලෙස ඉල්ලීමක් කර තිබේ.

**පරීක්ෂණයේදී අනාවරණය කරගත් කරුණු :**

2018.09.03 දින මෙම පැමිණිල්ලට අදාළ පළමු පරීක්ෂණය සිදු කරන ලදී. හොරණ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක හා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සිතාසි නිකුත් කර තිබුණද එදින ඉදිරිපත්ව නොසිටි අතර මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරිනී, වෛද්‍ය එරන්දි කුලරත්න මිය ද දිස්ත්‍රික් කර්මාන්ත ඉංජිනේරු, ටී.පී.ආර්.කේ.හේමචන්ද්‍ර මහතා ද පෙනී සිටියදී පරීක්ෂණය සිදු කරන ලදී. කර්මාන්ත ඉංජිනේරු මෙම පරීක්ෂණයට කැඳවා ගන්නා ලද්දේ පැමිණිලිකරු විසින් පැමිණිල්ල ගොනු කිරීමෙන් අනතුරුව වැඩිදුරටත් ඉදිරිපත් කළ කරුණු සළකා බැලීමෙන් අනතුරුව ඔහු ද මැදිහත් පාර්ශවකරු ලෙස හෝ වගඋත්තරකරුවෙකු ලෙස ඉදිරිපත් කරවා ගැනීම වඩාත් සුදුසු බව පෙනී ගිය බැවිනි.

මෙම කර්මාන්ත ශාලාව නැවත සක්‍රිය ලෙස ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම සම්බන්ධව විරෝධතාවයක් නොමැති බව පැමිණි සිටින වගඋත්තරකාර පාර්ශවය සහ මැදිහත් පාර්ශවකරු විසින් දක්වා සිටින ලදී. එමෙන්ම රැකියා 60කට ආසන්න ප්‍රමාණයක් බිහි කළ මෙම කර්මාන්ත ශාලාවේ

පැවැත්ම එම ප්‍රදේශයට හානියක් නොවන බව ද එම කර්මාන්ත ශාලාවේ සේවය කළ කිසිදු අයෙකු සෞඛ්‍යමය තර්ජනයකට ලක්ව නොතිබූ බව ද ලංකා කාර්මික තාක්ෂණ ආයතනය ද දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය ද කම්කරු දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය ද මින් පෙර ඉදිරිපත් කර ඇති වාර්තාවන් අනුව පැහැදිලි වන්නේ මෙම කර්මාන්ත ශාලාව කිසිදු කාර්මික හෝ පාරිසරික ගැටළු වලින් තොරව පවත්වාගෙන යන එකක් බවය. රසායනාගාර ශිල්පී ලෙස සේවය කළ ඉනෝකා සජීවනී වැලිකල යන අය වසර 20ක පමණ කාලයක් මෙහි සේවය කර ඇති අතර තවත් එසේ දීර්ඝ කාලයක් සේවය කළ සේවකයින් සිටින බව ද අනාවරණය වුවද ඔවුන් කිසිවෙකු හෝ අනතුරු දායක සෞඛ්‍ය තත්ත්වයකට පත්ව ඇති බව වාර්තා වී නොමැති අතර රසායන ද්‍රව්‍ය සමග කටයුතු කරන ස්ථානයක් වුවද ආරක්ෂිත තත්ත්වයන් යටතේ පවත්වාගෙන යාම මත ඔවුන් මෙන්ම සියළු සේවකයින් යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් තවදුරටත් සේවය කරන බව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කළ කරුණු අනුව අනාවරණය වේ.

මෙම සිදුවීම සිදුවූ දින දක්වා ම කිසිදු අනතුරක් හෝ සෞඛ්‍ය තර්ජනයක් මෙම කර්මාන්ත ශාලාව හේතුවෙන් සිදුවී ඇති බවක් අනාවරණය නොවේ. මෙම කර්මාන්ත ශාලාවට එරෙහිව මින් පෙර හොරණ මහේස්ත්‍රාත් අධිකරණයට නඩු අංක : 1504/16 යටතේ කරුණු වාර්තා කර ඇති නඩුකරයක් පිළිබඳව කරුණු අනාවරණය වුවද එකී නඩුකරයෙන් හඳුන්වා දී ඇත්තේ කර්මාන්ත ශාලාවට එරෙහිව ක්‍රියා කළ බාහිර පුද්ගලයින් තිදෙනෙකුගේ පැමිණිල්ලක් මත කළ චෝදනාවක් බව අනාවරණය වේ. එකී බාහිර පුද්ගලයින් තිදෙනා කර්මාන්ත ශාලාවට තර්ජනයක්ව සිටි බවද වරින් වර කප්පම් හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ඉල්ලමින් හිංසාකාරී ලෙස හැසිරෙන ලද පුද්ගලයින් බව ද ගිනි අවි පනතේ නීතිමය ප්‍රතිපාදන යටතේ නඩු පවරා ඇති තැනැත්තන් බව ද ප්‍රදේශයේ සිටින ප්‍රධාන දේශපාලනඥයකුගේ හිතවතුන් ලෙස කටයුතු කරන ලද අය බව ද පෙන්වා දෙමින් පැමිණිලිකරු දක්වා සිටින ලද්දේ ඔවුන් කර්මාන්ත ශාලාවට හිංසාවක් වන පරිදි ක්‍රියා කළ තැනැත්තන් බවය. කර්මාන්ත ශාලාවට විවිධ බලපෑම් කරමින් තර්ජනාත්මකව හැසිරුණු එම පුද්ගලයින්ගේ හා දේශපාලනඥයකුගේ වුවමනාව මත පොලිසිය විසින් ඔවුන්ගේ පැමිණිලි විභාග කොට අධිකරණයට කරුණු වාර්තා කර එම අවස්ථාවේ කර්මාන්ත ශාලාව පිළිබඳව වැරදි අදහසක් ආරෝපණය වන ආකාරයට ක්‍රියා කර තිබූ බව පැමිණිලිකරු පෙන්වා දෙන කාරණාවක් වේ. මෙම අනතුර සිදුවූ අවස්ථාවේදී අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී ද සාවද්‍ය කරුණු බී වාර්තාව මගින් ඉදිරිපත් කරමින් ප්‍රධාන පොලිස් පරීක්ෂක වරයා විසින් පැමිණිලිකරු ඇතුළු පිරිසට ඇප ලබාගැනීමට ඇති අවස්ථාව ද අහිමි වන ආකාරයට ක්‍රියා කර ඇති බව පරීක්ෂණ අවස්ථාවේ පැහැදිලි කර දෙන ලද බව ද දැක්විය යුතු ය.

එමෙන්ම පැමිණිලිකරු විසින් කියා සිටින විශේෂ කාරණාවක් වන්නේ පොලිසිය විසින් කටයුතු කළ ආකාරය තමාගේ දැඩි මානසික හිංසනයකට හේතු වූ බව ද මහේස්ත්‍රාත් වරයා ද පොලිසිය විසින් කියා සිටි කරුණුම පිළිගෙන තමා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද්දේ කර්මාන්ත ශාලා හිමිකරු වන තමාගේ ඇති මැදිහත්වීමක් නොමැති බව නීතිඥවරුන් විසින් කළ කරුණු පැහැදිලි කිරීම් වෙත ද සාධාරණ ඇහුම්කන් දීමකින් තොරව බව ය. ප්‍රදේශයේ බොහෝ පිරිසකට රැකියා ලබාදෙමින් ද මෙරටට විදේශ විනිමය උපයා දෙමින් ද කටයුතු කරන ලද පෞද්ගලික කර්මාන්ත ශාලාවක හිමිකරුවෙකු වන තමා පිළිබඳව නිසි ලෙස සළකා බැලීමකින් තොරව රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පිළිගත් රාජ්‍ය ආයතන ගණනාවක් විසින් ලබාදෙන ලද අනුමැතීන්ට යටත්ව මෙම කර්මාන්ත ශාලාව පවත්වාගෙන යන ලද බවට දක්වා සිටි කරුණු ද නොසළකා හරිමින් පොලිසිය විසින් කියා සිටි කරුණු මතම බව පෙන්වා දෙන ලදී. කොළඹ ප්‍රදේශයේ පිහිටි තම නිවසේ පදිංචිව සිටි පැමිණිලිකරු

අධිකරණයට ඉදිරිපත් වූ පසු රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලබන්නේ. හොරණ පිහිටි කර්මාන්ත ශාලාවේ හිමිකරු පැමිණිලිකරු වීම මත බව පෙනී යයි. අනතුර සිදුවූ අවස්ථාවේ කර්මාන්ත ශාලාවේ ප්‍රධාන කලමණාකරු ද පසු දින රසායනාගාර ශිල්පීනිය ද අත්අඩංගුවට ගෙන පොලිසිය විසින් අධිකරණයට ඉදිරිපත් කරනු ලබන්නේ ද දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු විසින් තම වාර්තා ඉදිරිපත් කිරීමටද පෙර බව අනාවරණය වේ.

මින් පෙර අවස්ථාවක දී දඹුල්ල කන්නම්පිටිය ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත ශාලාවක් වන බයෝ ෆුඩ්ස් කම්පණි නම් කර්මාන්ත ශාලාවේ ඇති වූ බරපතල ආකාරයේ කාර්මික අනතුරක් සිදුවූ අවස්ථාවක දී එකී වසමේ පොලිසිය සහ අධිකරණය විසින් කටයුතු කරන ලද්දේ අනතුර සම්බන්ධව ලද කරුණු පිළිබඳව අපක්ෂපාතී හා සාධාරණ ලෙස සළකා බැලීමෙන් අනතුරුව බව ඊට අදාළව දඹුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්වාගෙන යන ලද බී/284/18 දරණ නඩුවේ ලේඛනමය තොරතුරු ඉදිරිපත් කරමින් පැමිණිලිකරු කරුණු පැහැදිලි කරන ලදී. පැමිණිලිකරු විසින් එකී ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒවා තම පැමිණිල්ල විභාග කරන අවස්ථාවේදී ද සළකා බලන ලෙස දක්වා සිටී. එහිදී මහජනතාවගේ කැලඹීමක් ඇති වුවද පොලිසිය විසින් කර්මාන්ත ශාලා හිමිකරු අත්අඩංගුවට ගැනීමක් නොකළ බව අනාවරණය වේ.

2018.09.18 දින සිතාසි ප්‍රකාරව කොමිෂන් සභාව ඉදිරියේ පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් ද මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් ද ඉදිරිපත්ව සිටි නිලධාරීන් හමුවේ විමසා සිටින ලද්දේ කර්මාන්ත ශාලාව පවත්වාගෙන යාමට අවශ්‍ය පාරිසරික බලපත්‍රය අවලංගු කර තිබීමට හේතුව පිළිබඳ කරුණු පැහැදිලි කර දෙන ලෙසය. එහෙත් පරිසර බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය කිරීමක් සිදු කළ බව පැහැදිලි කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත් වූ බැවින් අනතුරුව විමසා සිටින ලද්දේ තාවකාලිකව අත්හිටුවා ඇති පරිසර බලපත්‍රය නැවත සක්‍රීය කිරීමට ඇති බාධාව කුමක්ද යන්න පිළිබඳව ය. මෙහිදී මධ්‍යම පරිසර අධිකාරිය වෙනුවෙන් පැමිණි නිලධාරීන් දක්වා සිටින්නේ පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙත පැමිණිලිකරු විසින් කළ අභියාචනය සළකා බලා එකී බලපත්‍රය සක්‍රීය කිරීමට ඔවුන්ගේ විරෝධතාවයක් නොමැති බවයි. තවද පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් පැමිණි නිලධාරීන් කියා සිටින්නේ මෙම බලපත්‍රය සක්‍රීය කිරීම පිළිබඳව එම අවස්ථාවේදී අමාත්‍යාංශය වෙනුවෙන් අවසන් ප්‍රකාශයක් කළ නොහැකි බවයි.

2019.01.07 දින හොරණ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙත පෙනී සිටීමට කළ දැන්වීමට අනුව මූලස්ථාන පොලිස් පරීක්ෂක ප්‍ර.පො.ප. ප්‍රසන්න වැලිකල මහතා සහ උ.පො.ප. එම්.ආර්.ආර්.දයානන්ද මහතා පෙනී සිටින ලදී. පොලිසිය විසින් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමේදී ද අනතුරට ලක් වූ ස්ථානය පරීක්ෂා කර පැමිණිලිකරු හෝ මෙම කර්මාන්ත ශාලාවේ නිලධාරීන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇති ආකාරය පිළිබඳව ද විමසා සිටින ලදී. එදින පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලිකරු වෙනුවෙන් ඉදිරිපත් වූ පැමිණිලිකරුගේ දියණිය වන බුද්ධිකා විජේරත්න යන අය පෙනී සිටිමින් දක්වා සිටියේ, එම සිද්ධිය සිදුවන අවස්ථාවේ තම පියා වන සරත් විජේරත්න යන අය හෙවත් මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු කර්මාන්ත ශාලාවේ රැඳී සිටි බව ද කිසිදු පලා යාමක් සිදු නොකළ බව ද මෙම සිදුවීම පිළිබඳව පසු දිනම එනම්, 2018.04.20 දින හොරණ මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරමින් පොලිසිය විසින් දක්වා ඇත්තේ, මෙම කර්මාන්ත ශාලාවේ හිමිකරු සිද්ධිය වූ ස්ථානයෙන් එම වේලාවේදීම එතනින් පලා ගිය බවට සාවද්‍ය කරුණු වාර්තා කර ඇති බවය. එලෙස ම ඔහු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වීම හා අධිකරණය ඉදිරියට පැමිණීම මගහැරිය බවට වරින් වර පොලිසිය විසින්

ඉදිරිපත් කළ බී වාර්තා අනුව හඳුනා ගතහැකි බව ද කිසිදු අවස්ථාවක අධිකරණය මග හැරීමක් හෝ කර්මාන්ත ශාලාවෙන් පලා යාමක් සිදු නොකළ පැමිණිලිකරු පිළිබඳ සාවද්‍ය කරුණු අධිකරණයට ඉදිරිපත් කිරීමට පොලිසිය කටයුතු කර ඇති බව කියා සිටින ලදී.

සී.සී.ටී.වී. පද්ධතිය ක්‍රියාත්මකව තිබූ නිසා එතුලින් ද මෙම කරුණු තහවුරු වන බවද විජේරත්න මහතා ප.ව.1.30 අවසන් වනතුරු ද එම ස්ථානයේ රැඳී සිටිමින් ගිලන් රථ ගෙන්වා අනතුරට පත් සේවකයින් රෝහල් ගතකරවීමට පියවර ගනිමින් සිටි බවද ඉන් අනාවරණය වන බව පැහැදිලි කරගත හැකි බව කියා සිටින ලදී. එහෙත් ඒ සියළුම දේ සිදු කර ඔහු එම ස්ථානයෙන් ඉවත්ව යන්නේ ගම්වැසියන් මෙම ව්‍යාපාරයේ හිමිකරුට හානියක් කිරීමට බොහෝ දුරට ඉඩකඩ තිබූ බැවින් බවද කියා සිටින ලදී. එය පලා යාමක් ලෙස කිසිසේත් සැලකිය නොහැකි බව ද පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කරමින් සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ බැවින් පැමිණිලිකරුට සිදුවූ අගතිය සුළු දෙයක් ලෙස සැලකිය නොහැකි බව පෙන්වා දෙන ලදී. එමෙන්ම මෙම සිදුවීම සිදුවූයේ 2018.04.19 වන දින වුවද 2018.04.25 වන දින තම නීතිඥවරුන් මාර්ගයෙන් අධිකරණයට ඉදිරිපත් වූ නමුත් එදින මහේස්ත්‍රාත්වරයා නොසිටි බැවින් නැවත ඉදිරි දිනය වූ 2018.04.27 දින අධිකරණයට ඉදිරිපත් වුවද මෙම පැමිණිල්ලේ පැමිණිලිකාර තම පියා රක්ෂිත බන්ධනාගාර ගත කළ බැවින් මානසිකව හා ශාරීරිකව හිංසා පීඩා විඳීමට සිදුවූයේ පොලිසිය විසින් අධිකරණයට ඉදිරිපත් කළ සාවද්‍ය කරුණු මත මෙන්ම මහේස්ත්‍රාත්වරයා විසින් ද තම නීතිඥවරුන් ඉදිරිපත් කළ සාධාරණ හා යුක්ති සහගත කරුණු වෙත සවන්දීමක් සාධාරණව සිදු නොකළ බැවින් බවද පෙන්වා දෙන ලදී. ඒ අනුව තම පියාට ද මෙම සමාගමේ නිලධාරීන් දෙදෙනෙකුට ද රක්ෂිත බන්ධනාගාර ගත වීමට සිදු වූ බවද පොලිසිය විසින් ඇප ලබාගැනීමට ඇති ඉල්ලීම් වලට ද පැහැදිලිවම විරුද්ධත්වය ප්‍රකාශ කිරීමෙන් පොලිසිය විසින් ද්වේශ සහගතව කටයුතු කළ බව පැහැදිලිවම පෙන්වා දියහැකි බව කියා සිටී. මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රසන්න වැලිකල මහතා කියා සිටින්නේ, පොලිසිය වෙත 119 දුරකථනය මගින් ප්‍රථම තොරතුර ලද බවද පළාත භාර සහකාර පොලිස් අධිකාරී විසින් දුරකථනයෙන් අමතා වහාම මෙම සිද්ධිය වූ ස්ථානයට පිටත්ව යන ලෙස දන්වා තිබූ බව ද පොලිස් ස්ථානයෙන් පිටත් වන විට වේලාව දහවල් 1.40 වූ බව ද ප.ව. 1.55ට පමණ එම ස්ථානයට යන විට විශාල පිරිසක් රැස්වී සිටි බව ද අනතුරට පත් දෙදෙනෙකු ලොරියක දමා රෝහලට පිටත් කළ බවදය. මෙම රෝගී තැනැත්තන් දෙදෙනා රෝහල් ගත කරන ලද්දේ රැස්ව සිටි පිරිස විසින් ද නැතිනම් පොලිසිය විසින් ද යන්න විමසා සිටීමේදී මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක මහතා කියා සිටින ලද කරුණු අනුව පෙනී යන්නේ පොලිස් ස්ථානයේ නිලධාරීන් එම ස්ථානයට යාමට පැයකට ආසන්න කාලයක් ගතවී ඇති බැවින් එකී කටයුතු රැස්ව සිටි පිරිස විසින් සිදු කර ඇති බවය.

ව්‍යාපාරයේ හිමිකරු පොලිස් නිලධාරීන් එම ස්ථානයට යන අවස්ථාවේ එම ස්ථානයේ දක්නට නොසිටි බවත් ආයතන භූමියේ බොහෝ ජනයා කලබල වී සිටි බව ද දේපළ විනාශ කිරීමට සූදානම්ව සිටි බවක් පෙනී ගිය බව ද එකී විනාශකාරී ක්‍රියාවන් වැළැක්වීමට පොලිසිය විසින් කටයුතු කළ බව ද ප්‍රකාශ කර සිටී. එම අවස්ථාවේ ආයතනයේ අධ්‍යක්ෂක හා කළමණාකාරු වන රත්නසිරි එදිරිසිංහ මහතා සිටි බැවින් ඔහුව පොලිසිය භාරයට ගත් බව ද ප්‍රදේශය භාර සහකාර පොලිස් අධිකාරී ද කොට්ඨාස භාර පොලිස් අධිකාරී ද පැමිණි පසු එම ස්ථානයේ ආරක්ෂාව බොහෝ දුරට තහවුරු කරගත් බව කියා සිටී. එමෙන්ම කරුණු විභාග කිරීමේදී රසායනාගාර පරීක්ෂකවරිය වන ඉනෝකා සජීවනී වැලිකඩ යන අය කියා සිටියේ, අදාල දින අප ජල ටැංකිය අසලින් දුර්ගන්ධයක් පැමිණි බව හඳුනා ගත් පසු ඒ පිළිබඳ සොයා බැලීමට දන්වා සිටි බවද ප.ව.1.00ට පමණ ආයතනයේ කම්කරුවකු වන එච්.කේ.ආරියපාල නැමැති අය රසායනාගාර සහායකයෙක් සමග එම ස්ථානයට ගොස් එම අප ජලය ටැංකියේ පියන ඇර එහි

අභ්‍යන්තරයේ පිහිටි කරාමයක් වැසීමට උත්සාහ ගත් බවය. කරාමය වැසීමට ටැංකිය ඇතුලට එම ආරියපාල යන අය නැමී හිස ඇතුල් කර ක්‍රියා කිරීමට යාමේදී ඔහු එතුළට වැටී ඇති අතර ඔහු සමග සිටි වරුන චන්ද්‍රසේකර යන අය ද ටැංකියට බැසීමට යාමේදී ඔහු ද ඇතුළට වැටුණු බව ද දැනගත් පසු තමා උදව් ඉල්ලා කෑ ගැසූ බව ප්‍රකාශ කරන ලදි.

නමුත් කර්මාන්තශාලාවේ හිමිකරු එම අවස්ථාවේ එම කර්මාන්ත ශාලාවේ සිටි බැවින් ඔහු ද වළට වැටුණු පිරිස ගැනීමට උත්සාහ කළ බව ද නමුත් එය ද අසාර්ථක වූ පසු කර්මාන්ත ශාලාවේ සිටි මිනිසුන් කෑ ගැසීමේදී ප්‍රදේශ වාසීන් ද අනතුරුට පත්වූ සේවකයින් ගොඩ ගැනීමට කටයුතු කළ බව ද ප්‍රකාශ කර සිටී.

එමෙන්ම මෙම සිදුවීමට අදාළව මූ.පො.ප. ගේ තොරතුරු සටහන් පොතේ සටහනක් පරීක්ෂණ අවස්ථාවේදී කියවමින් දක්වා සිටින්නේ මෙම කර්මාන්තශාලාවේ හදිසි ආපදා තත්ත්වයක් උද්ගතවුවහොත් ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හෝ නිසි උපදෙස් සේවකයින්ට ලබාදී නොමැති බව ද නිසි ආරක්ෂක සැලැස්මක් සකස් කර නොමැති බවදය. තවද මෙම විෂ අපද්‍රව්‍ය රැස්වන වළ ඉතාම අනාරක්ෂිත ලෙස පවතින බව ද සේවකයින් සහ අවට ප්‍රදේශවාසීන් පිළිබඳව වගකීමකින් තොරව ව්‍යාපාරයේ පාලක අධිකාරිය කටයුතු කර ඇති බව ද නිරීක්ෂණය කළ බව පෙන්වා දෙන ලදි. පාලන අධිකාරිය කර්මාන්ත ශාලාවේ වැඩ කරන සේවකයින් හා ප්‍රදේශවාසීන් පිළිබඳව කිසිදු ආරක්ෂිත වැඩ පිළිවෙලක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය කර තමා සටහන් කර ගත් බවද පෙන්වා දෙන ලදි.

නමුත් පැමිණිලිකරු වෙනුවෙන් කියා සිටින්නේ කර්මාන්තය පවත්වාගෙන ගොස් ඒ වනවිට වසර 25ක් පමණ වන බවද මෙම වසර 25ක කාලයේදී කිසිම අවස්ථාවක මෙවැනි අනතුරක් සිදුව නොමැති බව ද ය. එහෙත් මෙම අවස්ථාවේ පොලිස් නිලධාරීන් වෙතින් විමසා සිටින්නේ මෙම පරීක්ෂණයේදී කර්මාන්තශාලාව අනාරක්ෂිතයි යනුවෙන් හඳුන්වන්නේ කුමන හේතුවක් මතද යන්න පිළිබඳවය. එම ස්ථානය අපරාධයක් වූ ස්ථානයක් බැවින් හා විෂ වායුව නිකුත් වෙමින් තිබූ බවට අවට ප්‍රදේශයේ පැතිර තිබූ හුස්ම ගැනීමට පවා අපහසු තත්ත්වයක් මත බවද එසේ ප්‍රකාශ කරන බව කියා සිටිමින් කර්මාන්තශාලාවේ අයිතිකරු සහ පාලන අධිකාරිය සෘජුවම වගකිවයුතු බවටද ප්‍රකාශ කරන බව කියා සිටී.

කලමණාකරු අත්අඩංගුවට ගන්නා ලද්දේ විමර්ශන කටයුතු සඳහා බව ද රසායනාගාර පාලිකා ඉනෝකා සංජීවනී යන අයගෙන් ප්‍රකාශ සටහන් කරගත් බව ද දක්වා සිටින අතර තවදුරටත් මූලස්ථාන පොලිස් පරීක්ෂක මහතා විසින් කියා සිටින්නේ ඔහු මුළු කර්මාන්තශාලා පරිශ්‍රයේම ඇවිදගොස් පරීක්ෂා කළ බව ද කර්මාන්ත ශාලාව තුළ නිසි ආරක්ෂක සැලැස්මක් නොමැති බව ද හඳුනා ගන්නා ලද බවය. සේවකයින් හට මුඛ ආවරණ හෝ ආරක්ෂිත මෙවලම් සපයා නොමැති බව ද ප්‍රකාශ කර සිටී. මෙහිදී අනතුරට හේතුව කුමක්ද යන්න විමසීමේදී කියා සිටින්නේ විෂ වායුව කාන්දු වීමක් මත මෙම අනතුර සිදුව ඇති බවය. නමුත් විෂ වායුව කාන්දු වීම යනුවෙන් ප්‍රකාශ කරන්නේ කුමක්ද යන්න විමසීමේදී නැවත ප්‍රකාශ කර සිටින්නේ අප ජලය ටැංකියේ රසායනික ද්‍රව්‍ය මිශ්‍රව ඇති බැවින් එකී ටැංකියෙන් විෂ වායුව පිටවීම ඉන් අදහස් වන බවය තවද කරාමය වැසීමට සේවකයකු යාමට හේතුව විෂ වායුව කාන්දු වීම වැලැක්වීමට ගත් උත්සාහයක් බව පොලිසිය විසින් අනාවරණය කර ගත් බවද ය. මුල් අවස්ථාවේ බී වාර්තාවෙන් අධිකරණයට කරුණු වාර්තා කරමින් ඉල්ලා ඇත්තේ ස්ථානීය පරීක්ෂණයක් සහ පශ්චාත් මරණ පරීක්ෂණ කිරීමට බව ද දෙවැනි බී වාර්තාවෙන් පසු කරුණු දක්වා මහේස්ත්‍රාත් අධිකරණයේ අංක

34964 දරණ නඩුව යටතේ වැඩිදුරටත් කරුණු වාර්තා කරමින් අත්අඩංගුවට ගත් සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලද බව ද කියා සිටී. මෙම කරුණු දැක්වීමේදී ප්‍රධාන පොලිස් පරීක්ෂක විසින් අපරාධය යන වචනය භාවිතා කරමින් කරුණු ඉදිරිපත් කරන අතර අපරාධ ස්ථානය, සිදුවූ අපරාධය වැනි වචන භාවිතා කරන අතර ඒ අනුව අධිකරණයට කරුණු වාර්තා කිරීම සිදු කර ඇති බව බී වාර්තා පරීක්ෂා කිරීමේදී පෙනී යයි. √

පැමිණිලිකාර පාර්ශවය කියා සිටින්නේ මෙම රසායනික ද්‍රව්‍ය මිශ්‍ර අපද්‍රව්‍ය ටැංකිය විවෘත කරන ආකාරය සහ ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ලිඛිතවම අදාළ සේවකයින් හට උපදෙස් ලබාදී ඇති බව ද මෙය වසර 25ක් පුරාම ක්‍රියාත්මකව පැවති පිළිවෙත බව ද මින් පෙර කිසිදු අවස්ථාවක මෙවැනි අනතුරක් සිදුව නොමැති බවද සේවකයින් තම කටයුතු ලද උපදෙස් පරිදි ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව කරමින් තම රාජකාරි සිදු කළ බව ද පෙන්වා දෙන ලදි. එමෙන්ම මෙම අප ජලය පවතින ටැංකිය පිහිටි ස්ථානයේ භාරව කටයුතු කළ අනතුරට ලක්වූ වරුණ චන්ද්‍රසේකර යන අයට කටයුතු කළයුතු ආකාරය සම්බන්ධව ලිඛිතව කරුණු භාරදී තිබූ බව ද රබර් කර්මාන්ත ශාලාවක් ආශ්‍රිතව ඇතිවන දුර්ගන්ධය විෂ වායු පැතිරීමක් ලෙස විස්තර කිරීම සාධාරණ නොවන බව ද ඕනෑම රබර් කර්මාන්ත ශාලාවක් ආශ්‍රිතව දුර්ගන්ධයක් පැවතීම සාමාන්‍ය තත්ත්වයක් බව ද පෙන්වා දෙන ලදි. එමෙන්ම කිසිදු විෂ කාන්දුවීමක් නොවූ බවද ලබාදෙන ලද උපදෙස් වලට පරිබාහිරව සේවකයෙකුගේ ක්‍රියාකාරකම මෙම අනතුරට හේතු වූ බව ද පෙන්වා දෙන ලදි. මෙම ටැංකිය ඇතුලේ තිබූ කරාමයක් වැසීමට භාවිතා කරනු ලබන උපකරණය තිබියදී කරන ලද තනි පුද්ගල ක්‍රියාකාරකමක් මෙම අනතුරට හේතු වී ඇති බව ද පෙන්වා දෙන අතර ටැංකියේ එක් කොටසක් විවෘත කර එය කළයුතු බව ද එය තනි පුද්ගලයෙකුට කළ හැකි කාර්යයක් නොවන බව ද මුද්‍රා තබා ඇති මෙම ටැංකිය වසර 25ක් මුළුල්ලේ ක්‍රියාත්මක වන්නේ රජයේ ආයතන වල නියමිත ප්‍රමිතීන්ට අනුව බව ද මෙකී අප ජල ටැංකිය මධ්‍යම පරිසර අධිකාරියේ ද රබර් පර්යේෂණ ආයතනයේ ද කම්කරු දෙපාර්තමේන්තුවේ ද විමර්ශන වලින් අනතුරුව ලද උපදෙස් අනුව සකස් කළ ටැංකියක් බව ද පෙන්වා දෙන ලදි. එය ඕනෑම පුද්ගලයෙකුට අවශ්‍ය ආකාරයට සකස් කළහැකි හෝ ක්‍රියා කළහැකි එකක් නොවන බව ද මෙම කර්මාන්තශාලාව විවිධ කාල වකවානු වල ලබාගන්නා ලද ප්‍රමිති සහතික මත කටයුතු කරන කර්මාන්ත ශාලාවක් බව ද මාස තුනෙන් තුනට ඉහත කී ආයතන විසින් කරන ලද පරීක්ෂණ වලට යටත්ව කර්මාන්තය පවත්වාගෙන ආ බවද කිසිදු අවස්ථාවක එම ආයතන මෙම අප ජල ටැංකියේ දෝෂයක් ඇති බව දක්වා නැති බව ද මෙම අනතුර කර්මාන්තශාලා හිමිකරුගේ හෝ කළමණාකාරීත්වයේ වරදකින් සිදුවූ එකක් නොවන බව ද පෙන්වා දෙන ලදි.

එමෙන්ම මෙම අනතුර සිදුවූ දින වරුණ චන්ද්‍රසේකර නැමැති රසායනාගාර සහායක නිලධාරි වරයා කම්කරුවෙකු ද රැගෙන එම අප ජල ටැංකියේ පිහිටි කරාමයක් වැසීමට පියවර ගෙන ඇත්තේ එම ස්ථානයේ තිබූ ඊට අදාලව භාවිතා කරනු ලබන උපකරණය භාවිතා කිරීමකින් තොරව බව ද එම උපකරණය එහි තිබී ඇති බව අදාල ඡායාරූප මගින් තහවුරු කිරීමට මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනුවට ලබාදී ඇති බව ද කියා සිටී. එමෙන්ම මෙම ටැංකියේ කුඩා කොටසක් විවෘත කර එම කරාමය වැසීමට භාවිතා කරනු ලබන යකඩ කූරක් සහිත හැඬලය භාවිතා නොකර එක් අයෙකු ඇතුළට බැස එම කරාමය වැසීමට කටයුතු කිරීම අනතුරට හේතුවක් වී ඇති බව ද පෙන්වා දෙන අතර පැමිණිලිකරු වෙනුවෙන් පෙන්වා දෙනු ලබන්නේ මෙම ටැංකිය තුල රසායන ද්‍රව්‍ය මිශ්‍ර අප ජලයෙන් නිකුත් වන වායූන් තිබෙන බැවින් ඇතුළට බැසීමේදී සිහිසුන් වීම සිදුවිය හැකි බව ද ය. එමෙන්ම පැරණි වලකට, ළිඳකට හෝ එවැනි ගැඹුරු ස්ථානයක ඕනෑම අවස්ථාවක ස්වභාවිකව වුවද විෂ වායුවක් පැවතිය හැකි බව ද

පෙන්වා දෙන ලදි. වසර 25 ක් මෙම කර්මාන්ත ශාලාව ක්‍රියාත්මකව තිබියදී කිසිදු අවස්ථාවක මෙම ටැංකියට සේවකයකු බැස නොමැති අතර එක් සේවකයෙකු කළ ක්‍රියාවක් මත සිදුවූ අනතුරුදායක තත්ත්වයක් බව ද කළමණාකාරීත්වය ලබාදී ඇති ආරක්ෂාකාරී ක්‍රියා අනුගමනය කිරීමකින් තොරව කටයුතු කිරීම අනතුරට හේතුවක් වී ඇති බව ද පෙන්වා දෙන ලදි.

මෙම අවස්ථාවේ ඉනෝකා සංජීවනී වැලිකල යන රසායනාගාර පාලිකාව විසින් කරන ලද ප්‍රකාශයක් පොලිසිය සතුව පවතින බව කියා සිටින බැවින් එය පරීක්ෂණ අවස්ථාවේ කියා සිටීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක කටයුතු කරන ලදි. එකී ප්‍රකාශය පරීක්ෂණ අවස්ථාවේ දීර්ඝව විස්තර කරන අතරතුර ඇති එක් කාරණාවක් වන්නේ "ඒ වෙලාවේ ටැංකියේ උඩ පියන වහල තිබුණේ එතකොට ආරියපාලත් වරුණත් දෙන්නා එකතු වෙලා ටැංකියේ පියනේ කොටසක් උඩට ඇරලා ටැංකියේ භූගත වතුර එන කරාමය වහන අවස්ථාවේ වරුණ මල්ලි කිව්වා "කරාමය වහන එක හොයාගන්න, ඒකෙන් කරාමය වහන්න" කියලා. ආරියපාල කිව්වා "නෑ ප්‍රශ්නයක් නෑ" කියමින් උඩට ඇරලා තියෙන පියන විවෘත කර ක්ෂණිකව ටැංකිය ඇතුලේ උඩ කොටසේ පියනේ ගැට්ටට බැස්සා. ඒ අතරේ මමත් කිව්වා "ඔහොම බහින්න එපා අවදානම් " කියලා. ඒවා කිසිවක් ගණන් නොගෙන ආරියපාල ඒ ගැට්ට උඩ ඉඳලා කරාමය වහන්න පටන් ගත්තා. කරාමයෙන් භාගයක්ම ආරියපාල කිව්වා කරදරයක් නැතුව වහලා ඉතිරි කොටස වහන්න තව ටිකක් ටැංකියට ඇග පහත් කලා. ඒත් එක්කම ආරියපාල ටැංකියට වැටුණා. " යන ලෙස වේ.

මෙහිදී පොලිසිය විසින් ප්‍රකාශ කරන්නේ හුස්ම ගත නොහැකිව බිමට වැටුණු බවය. එය භූගත ජල ටැංකියේ පියන ඇර තිබූ බැවින් විෂ වායුව පරිසරයට කාන්දු වූ බැවින් බව කියා සිටී. එහෙත් එළියේ හිටපු කිසිම කෙනෙකුට කිසිම දෙයක් නොවූ බව ද ප්‍රකාශ කරමින් පැමිණිලිකරු කියා සිටින්නේ පොලිසිය අසත්‍ය ප්‍රකාශ කරන බව ද එසේ බිම වැටුණා නම් පළමුව ඉනෝකා සංජීවනී වැලිකල යන අයද බිම වැටී සිහිසුන් වියයුතු බවය. මක් නිසාද ඇය ටැංකිය දෙස සිට සිදුවීම දැක කෑගසමින් ආ අයෙකු බැවිනි. වටපිටේ කිසිම කෙනෙකුට කිසිම දෙයක් නොවූ බැවින් පරිසරයට විෂ වායුව පිටවූ බව ප්‍රකාශ කිරීම අසත්‍ය බව පැමිණිලිකාර පාර්ශවය පෙන්වා දෙන ලදි.

පොලිසිය ප්‍රකාශ කරන්නේ, මෙම සිද්ධිය වන විට මුහුණු හා නාසය ආවරණය කරනු ලබන ආරක්ෂිත උපකරණයක්වත් ආයතනයේ නොතිබුණු බවය. නමුත් පැමිණිලිකරු කියා සිටින්නේ සියළු මුඛ සහ නාසය ආවරණය කරනු ලබන උපකරණ තිබූ බව ද ඒවා බිම වැටී තිබූ ආකාරය කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත පරික්ෂක ඉංජිනේරු විසින් ලබාගත් ඡායාරූප වල ඇතුළත් බව දුටු බවය.

මෙම කර්මාන්ත ශාලාවේ අනාරක්ෂිත තත්ත්වයක් තිබුණා යයි ප්‍රකාශ කරන්නේ කුමන හේතුවක් මත ද යන්න පරීක්ෂා කර බැලීමේදී පෙනී යන්නේ පොලිසිය විසින් එසේ කියා සිටින්නේ ගිනි නිවීමේ උපකරණ දෙකක් කල් ඉකුත්වී තිබූ බවට ප්‍රකාශ කිරීම ද සිද්ධිය වූ අවස්ථාවේ මිනිසුන් කර්මාන්ත ශලාවට පැමිණීම වළක්වා ගැනීමට පියවර නොගැනීම මත බව ද පෙනී යයි. එහෙත් පැමිණිලිකරු කියා සිටින්නේ ගිලන් රථ කඩිනමින් කර්මාන්ත ශාලාව තුළට කැඳවා ගැනීමේදී ගේට්ටු විවෘත කළ පසු වටපිට රැස්ව සිටි ජනතාව කර්මාන්ත ශාලාව තුළට පිවිසි බැවින් ද අසල අවුරුදු උත්සවයක් තිබූ බැවින් ද එහි රැස්ව සිටි පිරිසක් ගිලන් රථ සඳහා විවෘත කළ ගේට්ටු හරහා පැමිණි නමුත් මෙවැනි අවස්ථාවක මහජනයා රැස්වන සහ කෑ ගසන ආකාරය ස්වභාවික බවත් එය ආරක්ෂාව හා සම්බන්ධ ප්‍රශ්නයක් බවට දක්වා කර්මාන්ත ශාලාවට එරෙහිව ප්‍රකාශ කිරීම සුදුසු නොවන බවය. සී.සී.ටී.වී.දර්ශන තුළින් මෙම කරුණු තහවුරු කරගතහැකි බව ද පෙන්වා දෙන ලදි.

පොලිසිය වෙතින් විමසා සිටින්නේ මෙය අපරාධයක් ලෙස හඳුනා ගන්නේ ද නැතිනම් හදිසි අනතුරක් ලෙස හඳුනා ගන්නේ ද යන්නය. එහෙත් පොලිසියේ පිළිතුර වන්නේ මෙය අපරාධයක් බවද එසේ කියන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 277 වගන්තිය අනුව බවද විෂ ද්‍රව්‍ය තැන්පත් කරලා තිබෙන ස්ථානයට අදාලව අපරීක්ෂාකාරී ස්ථානය අනුව අපරාධයක් බවට අධිකරණයට කරුණු වාර්තා කළ බව ද දක්වා සිටී.

මෙහිදී අපරීක්ෂාකාරී තත්ත්වයක් ලෙස පොලිස් ස්ථානාධිපති විසින් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව විමසා සිටීමේදී කියා සිටින්නේ මෙම සිද්ධිය වූ අවස්ථාවේ පොලිසියේ නිලධාරීන්ට හෝ අනතුරට ලක්වූ අය බේරා ගැනීමට යාමට පරීක්ෂාකාරීව යාමට අවශ්‍ය කිසියම් උපකරණයක් නොතිබූ බැවින් එසේ ප්‍රකාශ කරන බවය. එනම්, මුහුණු, නාසය හෝ මුඛ ආවරණයක් නොමැතිවීම අපරීක්ෂාකාරී යන වචනය භාවිතා කිරීමට හේතු වූ බව කියා සිටී.

අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී කර්මාන්තශාලා හිමිකරු පලා ගියා යනුවෙන් ප්‍රකාශ කිරීමට හේතුව කුමක්ද යන්න විමසීමේදී ප්‍රධාන පොලිස් පරීක්ෂක විසින් කියා සිටින්නේ, එසේ වාර්තා කළ බව සත්‍ය බවද කර්මාන්ත ශාලා හිමිකරු එහි නොසිටි බැවින් එසේ කළ බවය. තවද මෙම සිද්ධිය වූ ස්ථානයට හෝ පොලිසියට හෝ ඔහු පැමිණ නොතිබූ බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. එහෙත් පැමිණිලිකරු කියා සිටින්නේ කිසිදු දුරකථන ඇමතුමක් හෝ සිතාසියක් හෝ පොලිසිය විසින් හෝ අධිකරණය විසින් හෝ ව්‍යාපාර හිමිකරුට ලබාදී නොතිබූ බව ද සිදුවීම සිදුවන අවස්ථාවේ කර්මාන්ත ශාලාවේ රැඳී සිට කඩිනමින් අනතුරට පත්වූ අය ගිලන් රථ මගින් රෝහල් ගතකරවීමට කටයුතු කරමින් සිට ඇති බව සී.සී.ටී.වී.දර්ශන වල ඇති බවද කර්මාන්ත ශාලාවේ සිට පලා ගියා යන්න ප්‍රකාශ කිරීම සාවද්‍ය බවය.

තවද පැමිණිලිකාර පාර්ශවය වෙනුවෙන් කියා සිටින්නේ, මෙම සමාගම වෙනුවෙන් කළමණාකරු ඉදිරිපත්ව සිටියදී අධ්‍යක්ෂ පරිපාලන හා කළමණාකරණ ලෙස කරුණු දක්වා ඇතත් තවදුරටත් කර්මාන්තශාලාවේ හිමිකරු පොලිසිය වෙත කැඳවියයුතු බවට තීරණය කරන්නේ කුමන හේතුවක් මත ද යන්න පිළිබඳ පැහැදිලි නීතිමය හේතුවක් අනාවරණය වී නොමැති බවය. පොලිසිය විසින් ප්‍රකාශ කරන්නේ හිමිකරු අත්අඩංගුවට ගැනීමක් සිදු කර නැති බව ය. එහෙත් අයිතිකරු අත්අඩංගුවට ගැනීමට නියමිත බව අධිකරණයට තම "බී" වාර්තාව තුළින් දක්වා ඇති බව පෙන්වා දීමේදී පොලිසිය කියා සිටින්නේ, අයිතිකරුගේ වගකීමක් ඇති බැවින් එසේ කටයුතු කර ඇති බව ය. හිමිකරු කර්මාන්ත ශාලාවේ එම සිදුවීම වූ අවස්ථාවේ සිටි බැවින් තවදුරටත් ඊට ඇති වගකීම යටතේ එසේ දක්වා ඇති බව පොලිසිය විසින් කියා සිටී. එහෙත් සී.සී.ටී.වී. උපකරණ තුළින් කර්මාන්ත ශාලාවේ සිදුවූ ක්‍රියාකාරකම දැක බලාගතහැකි බව පැමිණිලිකරු වෙනුවෙන් ප්‍රකාශ කරන අතර වැඩිදුරටත් පැමිණිලිකරු කියා සිටින්නේ, කර්මාන්ත ශාලා භූමියට පැමිණි ජනතාව වළක්වා ගැනීමට පියවරක් පොලිසිය නොගත් බවයි. නමුත් පොලිසිය ප්‍රකාශ කරන්නේ, දරන ලද උත්සාහයකින් අනතුරුව ජනතාව ඉවත් කළ බවය.

දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරුවරයාගේ වාර්තාවක් ද මෙම කර්මාන්ත ශාලාවේ සිදුවූ අනතුර සම්බන්ධව ලබාදී ඇති බව කියා සිටින අතර පැමිණිලිකාර පාර්ශවය දක්වන්නේ, සේවකයකුගේ නොසැලකිලිමත් භාවය මත සිදුවූ කාර්මික අනතුරක් ලෙස එහි වාර්තා වී ඇති බවය. තවද පැමිණිලිකරුවන් කියා සිටින්නේ, පොලිසිය විසින් කටයුතු කිරීමේදී තම සමාගමට එරෙහිව එක ආකාරයකටත් වෙනත් සමාගම් පිළිබඳව තවත් ආකාරයකටත් කටයුතු කරන බවට පෙන්වා දීමට හැකි බව ද 2018.09.14 වැනි දින ඉංගිරිය පොලිස් වසමට අයත් ප්‍රිමියර් රබර් නම් ආයතනයේ ගෑස්

සාන්ද්‍රවීමක් මත දෙදෙනෙකු මිය ගොස් 05 දෙනෙකු තුවාල වූ අවස්ථාවේ කර්මාන්ත ශාලාවේ කිසිවෙකු හෝ අත්අඩංගුවට නොගත් බවත් අධිකරණයට කරුණු වාර්තා කිරීම සිදුවූ බවත් ය. එමෙන්ම දඹුල්ල ප්‍රදේශයේ බයෝ ෆුඩ්ස් නම් කර්මාන්ත ශාලාව ආශ්‍රිතව ඇතිවූ කාර්මික අනතුරකදී ද කර්මාන්ත ශාලාවේ කලමණාකාරිත්වය අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවක් සිදු නොවූ බව ය. එමෙන්ම පොලිසිය විසින් අධිකරණයට ඉදිරිපත් කළ "බී" වාර්තාවේ තිබෙන වචනයක් වචනයක් පාසා ඇති සාවද්‍යතාවය ඔප්පු කිරීමට තරම් පැමිණිලිකරුවන් කටයුතු කරන බව ද කියා සිටින ලදී. පළමු වරට අධිකරණයට ඉදිරිපත් කළ "බී" වාර්තාවේ මෙම අප ජල ටැංකිය සම්බන්ධව අනාරක්ෂිත හා අනතුරු දායක ටැංකිය යන වචනය භාවිතා කර වැඩිදුර කරුණු අධිකරණයට වාර්තා කරමින් "බී"වාර්තා ඉදිරිපත් කල අවස්ථා වලදී එය රසායනික ද්‍රව්‍ය සහිත ටැංකිය ලෙස වැනි වචන භාවිතා කරමින් මහේස්ත්‍රාත් වරයා වෙත වැරදි නිගමනයකට එළඹියහැකි ආකාරයේ තත්ත්වයක් නිර්මාණය කිරීමෙන් ඇප ලබාගැනීමට ඇති අවස්ථාව අහිමි වන ආකාරයට කරමාන්ත ශාලාවේ හිමිකරු බරපතල වරදක් කල බව හැඟී යන ලෙස කටයුතු කල පුද්ගලයෙකු බව පෙන්වා දීමට ද්වේශ සහගතව ක්‍රියා කලබව ද ඉන් පුද්ගල නිදහස අහිමි කිරීමට ක්‍රියා කළ බවද ප්‍රකාශ කර සිටී. තවද පෙත්සම්කරු වෙනුවෙන් ප්‍රකාශ කර සිටින්නේ, සාවද්‍ය කරුණු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් ද නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීමෙන් ද සාධාරණ නොවන පරීක්ෂණ කටයුතු සිදු කිරීමෙන් ද පොලිසිය ඇතුළු වගඋත්තරකරුවන් විසින් කරන ලද ක්‍රියාවන් පිළිබඳව ඉහළම අධිකරණය දක්වා සාධාරණත්වය බලාපොරොත්තුවෙන් තවදුරටත් ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන බව ද කිසිදු ආකාරයක හිංසනයකින් තොරව ජීවත් වුණු පැමිණිලිකරුට එරෙහිව වගඋත්තරකරුවන් කටයුතු කළ ආකාරය තුළින් සිදුවූ මානසික හිංසනයට ගතහැකි සෑම ක්‍රියා මාර්ගයක්ම ගන්නා බවය.

2019.03.21 වන දින සහ 2019.05.10 දිනයන්හිදී පැවති පරීක්ෂණයේදී කළුතර දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු මහතා වන පී.පී.ආර්.කේ.හේමචන්ද්‍ර මයා ඉදිරිපත්ව පහත සඳහන් කරුණු දක්වා සිටින ලදී. ඔහු කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ආරක්ෂක අංශය යටතේ දිස්ත්‍රික් පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය යටතේ දිස්ත්‍රික් කර්මාන්ත ඉංජිනේරු ලෙස කළුතර දිස්ත්‍රික්කය වෙනුවෙන් කටයුතු කරන බව පෙන්වා දෙන ලදී.

පොලිසිය විසින් කිසිදු අවස්ථාවක මෙම අනතුර සිදුවූ ස්ථානය පරීක්ෂා කිරීමට දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත්වීමට දක්වා නැති බව දක්වා තිබේ. එමෙන්ම ලද තොරතුරු අනුව මෙම ස්ථානයට තමා විසින් ඉදිරිපත් වූ බව ද පොලිසියට ඇත්තේ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පැවැත්වියහැකි පරීක්ෂණයක් වුවද කර්මාන්ත ශාලා ආඥා පනත යටතේ පැවරී ඇති බලතල යටතේ දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු හට එවැනි ස්ථානයකට පිවිස පරීක්ෂණයක් කිරීමට ඇති බලතල වලට පොලිසිය විසින් බාධාවක් නොකළයුතු බව ද ප්‍රකාශ කර සිටී. ජීවිත අනතුරක් සිදුවෙමින් පවතින අවස්ථාවක එය වළක්වා ගැනීමට අවශ්‍ය පියවර හැර අනතුරක් සිදුවූ ස්ථානයක එකී අනතුර සිදුවූ පසු යම් යම් විද්‍යාත්මක සාක්ෂි වලට බාධා වන ආකාරයට කටයුත්තක් නොවියයුතු වුවද පොලිසිය විසින් එම අනතුර වූ ස්ථානයට තමා ඇතුල්වීමට කටයුතු කිරීමේදී පවා ප්‍රමාද කළ බව ද මහේස්ත්‍රාත් පරීක්ෂණය පවත්වන තුරු ඇතුල්වීමට ඉඩ ලබාදිය නොහැකි බව ප්‍රකාශ කළද දේශපාලනඥයෙකුට ඇතුළට යාමට ඉඩ ලබාදුන් බව දුටු බවද ප්‍රකාශ කර සිටී. තමා සමග සහකාර කම්කරු කොමසාරිස් ද නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ද සිටියද පැය 1/2කට ආසන්න කාලයක් යනතුරු අනතුර සිදුවූ ස්ථානයට යාමට නිල වශයෙන් ඉල්ලා සිටි සහාය ද ලබා නොදුන් බව කියා සිටී. කර්මාන්ත ශාලා ආඥා පනතට අනුව කර්මාන්ත ශාලාවේ නොසැලකිලිමත් භාවය මත සිදුවූ අනතුරක් තිබේනම් හා

කර්මාන්ත ශාලා ආඥා පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය කර ක්‍රියාකර තිබේනම් අධිකරණයට කරුණු වාර්තා කර පැමිණිල්ලක් කිරීමේ බලය කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු සතුව පවතින බවද නැතිනම් අධිකරණය විසින් වාර්තාවක් කැඳවූ අවස්ථාවක මෙවැනි අනතුරක් සම්බන්ධව ලබා ගන්නා වාර්තාවක් ඉදිරිපත් කළහැකි බව ද පෙන්වා දෙන ලදි. එමෙන්ම මෙම අවස්ථාවේ මෙම කර්මාන්ත ශාලාවේ නොසැලකිලිමත් භාවය මත සිදුවූ අනතුරක් නොව සේවකයා විසින් නොසැලකිලිමත් භාවය මත කටයුතු කිරීම මත ද ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය නොකිරීමෙන් හා අදාළ උපාංග භාවිතා නොකිරීමෙන් සිදුවූ අනතුරක් බව ද එකී අනතුරු දායක ක්‍රියාව සිදු නොකරන ලෙස කාර්යය මණ්ඩලයේ සේවිකාවක වන රසායනාගාර පාලිකා ඉනෝකා සංජීවනී වැලිකල යන අය විසින් ප්‍රකාශ කළද එය නොතකා හරිමින් කරන ලද ක්‍රියාවක් හේතුවෙන් සිදුවූවක් බව පෙන්වා දෙන ලදි. එමෙන්ම කර්මාන්ත ශාලා ආඥා පනත අනුව කර්මාන්ත ශාලාවට එරෙහිව පැමිණිල්ලක් අධිකරණයට ගොනු කිරීමට තරම් හේතුවූ කාරණාවක් මෙම කර්මාන්තශාලාවේ සිදුවූ සිදුවීම ආශ්‍රිතව ඇතිවී නොමැති බවද පෙන්වා දෙන ලදි. තවද මෙම පැමිණිලිකරුගේ ඉල්ලීමක් මත අධිකරණයට කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරුගේ වාර්තාව කැඳවා ඇත්තේ ද මෙම අනතුර සිදුවීමෙන් මාස තුනක් හෝ හතරක් පමණ කාලයක් ගතවීමෙන් පසුව බව ද පෙන්වා දෙන ලදි. කර්මාන්ත ශාලා ආඥා පනත අනුව කර්මාන්ත ශාලාව විසින් සිදු කරන ලද වරදක් මත අපරාධයක් සිදුව තිබුණේ නම් මහේස්ත්‍රාත්වරයා විසින් හෝ පොලිසිය විසින් පළමුව කළයුතුව තිබුණේ කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරුවරයාගේ වාර්තාව කඩිනමින් කැඳවීම වුවද මෙම සිදුවීමෙන් මාස තුනක් හෝ හතරක් පමණ වනතුරු එවැනි වාර්තාවක් කැඳවා නොතිබීමෙන් පෙනී යන කාරණාවක් වන්නේ අධිකරණය විසින් හෝ පොලිසිය විසින් දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරුවරයාගේ කාර්ය භාරය නොසළකා හැර තිබීම බව ද පෙන්වා දෙන ලදි.

කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු විසින් සිය වාර්තාවේ කර්මාන්ත ශාලාවේ පරිපාලනමය දෝෂයක් මත හටගත් අනතුරක් නොවන බව පෙන්වා දී තිබියදී පොලිසිය විසින් අධිකරණයට මෙය අපරාධයක් බව දක්වා කරුණු වාර්තා කිරීම මත ඊට පදනම්ව අධිකරණය විසින් නඩු කටයුතු පවත්වාගෙන යන අවස්ථාවක් බව අනාවරණය වේ.

තවදුරටත් පසුව වාර්තා වූ කරුණු අනුව පෙනී යන්නේ මෙම නඩුව පවත්වාගෙන යාමට තරම් හේතු තිබේද යන්න විමසමින් නීතිපති වෙත පොලිසිය විසින් ඉල්ලීමක් කර ඇති බවය.

එමෙන්ම දඹුල්ල ප්‍රදේශයේ සහ ඉංගිරිය ප්‍රදේශයේ ද වවිනියාව ප්‍රදේශයේද කර්මාන්ත ශාලා ආශ්‍රිතව ඇතිවූ අනතුරු දායක සිදුවීම් මත පුද්ගලයින් ජීවිතක්ෂයට පත්ව තිබුණ ද එකී කර්මාන්ත ශාලාවන්හි හිමිකරුවන් අත්අඩංගුවට ගෙන නොමැති බව ද කරුණු මහේස්ත්‍රාත්වරයාට වාර්තා කිරීමේදී කර්මාන්ත ශාලා හිමිකරු අත්අඩංගුවට ගතයුතු බවට දක්වා නොමැති බවද පැමිණිලිකරු ඊට අදාළ බී වාර්තා ඉදිරිපත් කරමින් පැහැදිලි කර දෙන ලද අතර එය කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු මහතා ද අනුමත කරන ලදි.

මෙහිදී පොලිසිය විසින් හොරණ මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරමින් දක්වා ඇත්තේ කර්මාන්ත ශාලාවේ හිමිකරු පොලිසියට සහාය ලබා නොදී ඇති බවද පලා ගොස් ඇති බව ද ය. නමුත් පැමිණිලිකරු කියා සිටින්නේ එම අවස්ථාවේ අනතුරට පත් අය ගිලන් රථ මගින් රෝහල් ගතකරවීම දක්වා අවශ්‍ය සහාය ලබාදෙමින් ක්‍රියා කළ බවද විශාල ජනතාවක් ප්‍රකෝපකාරී ලෙස හැසිරීම මත තම ජීවිතයට අනතුරක් ඇති කළහැකි යැයි සැකයක් ඇතිවූ බැවින් තවදුරටත් කර්මාන්ත ශාලාවේ

කලමණාකාර අධ්‍යක්ෂ ඇතුළු ඉහළ කලමණාකාරිත්වය වෙත අවශ්‍ය පියවර ගැනීමට දන්වා පැමිණිලිකරු නිවසට පැමිණි බවය. කර්මාන්ත ශාලා හිමිකරු කොළඹ ප්‍රදේශයේ පිහිටි තම නිවසේ සිටියදී පොලිසිය විසින් අධිකරණයට කරුණු වාර්තා කර ඔහු අත්අඩංගුවට ගැනීමට ඉල්ලීමක් කර ඇති බව ද ඔහු පලා ගොස් ඇති බවටද කරුණු දක්වා අධිකරණය නොමග යැවීමට ක්‍රියා කර ඇති බව ද පැමිණිලිකරු දක්වා සිටින ලදි.

මෙම පරීක්ෂණ අවස්ථාවේ කර්මාන්ත ශාලා ආඥා පනතේ 95 වගන්තියේ ඇති කරුණු වඩාත් වැදගත් වන බව අනාවරණය වූ බැවින් ඒ වෙත අවධානය යොමු කරන ලදි. ඒ අනුව එහි 95:1 හා 95:2 ට අනුව දක්වා ඇත්තේ කර්මාන්ත ශාලාවක හෝ වෙනත් ස්ථානයක සේවය කරනු ලබන කිසිවෙකු විසින් එම කර්මාන්ත ශාලාවෙහි හෝ ස්ථානයේ සෞඛ්‍ය ආරක්ෂාව හෝ සුභසිද්ධිය උදෙසා ලබා දී ඇති උපකරණයක් හෝ පහසුකමක් තිබේ නම් එය භාවිතා කළයුතු බව ද එවැනි ආකාරයක අන්තරායක් වන පරිදි ඕනැකමින් හා යුක්ති සහගත හේතුවක් නොමැතිව කිසිවක් කළ නොහැකි බව ද ලෙස වේ.

තවද මෙම සමාගමට නීතිමය පුද්ගල භාවයක් ඇති බැවින් මෙම සිදුවීම සම්බන්ධව අධ්‍යක්ෂක පරිපාලන හා කලමණාකරු ඉදිරිපත්ව සිටියදී කර්මාන්ත ශාලාවේ හිමිකරු අවශ්‍ය බවට අධිකරණයට කරුණු වාර්තා කරමින් පොලිසිය විසින් ක්‍රියා කිරීම අවශ්‍ය එකක් ද යන්න පිළිබඳ ගැටළුවක් මතුවේ. මින් පෙර කර්මාන්ත ශාලා සම්බන්ධව අනතුරු සිදුවූ අවස්ථා වලදී කර්මාන්ත ශාලාවේ හිමිකරු සොයා අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමේ ආකාරයක් අනාවරණය නොවේ. රස පරීක්ෂක වාර්තාව වෙත අවධානය යොමු කිරීමේදී එතුලින් ද පෙනී යන්නේ, කර්මාන්ත ශාලාව වරදක් කළ බවට අනාවරණය කර නොමැති බව ය.

මධ්‍යම පරිසර අධිකාරිය ද කර්මාන්ත ශාලාවේ බලපත්‍රය තාවකාලිකව අවලංගු කරමින් ක්‍රියා කර ඇත්තේ පාරිසරික කොන්දේසි කඩ නොකර කටයුතු කරමින් තිබූ කර්මාන්ත ශාලාවකට එරෙහිව බව ද පැමිණිලිකරු විසින් පෙන්වා දෙන ලද අතර ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය තම විෂය පථයට අදාළ නොවන කාරණාවක් සම්බන්ධව මැදිහත්ව ක්‍රියා කර තිබේද යන්න පිළිබඳව ගැටළුවක් මතුවේ.

**නිරීක්ෂණ සහ නිගමන :**

මෙම පැමිණිල්ලට අනුව කරන ලද පරීක්ෂණ කටයුතු සහ වගඋත්තරකරුවන් වෙතින් ලැබී ඇති වාර්තා ද දෙපාර්ශවයේ ලිඛිත දේශන ද මෙන්ම සියලු පර්ශවයන් විසින් අමුණා ඉදිරිපත් කර ඇති ලේඛන ද වෙත අවධානය යොමු කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් පවත්වා ගෙන යනු ලබන S&C ලේටෙක්ස් පුද්ගලික සමාගම, හොරණ පොලිස් වසමේ බැල්ලපිටිය ප්‍රදේශයේ පිහිටා ඇති රබර් නිෂ්පාදන කර්මාන්ත ශාලාවකි. මෙහි සේවකයින් 60 ක පමණ වූ ප්‍රමාණයක් සේවය කරන අතර කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ආයෝජන මණ්ඩලයේ අනුමත ආයතන වලට පමණක් අලෙවි කරන බවද විදේශ විනිමය උපයන ආයතනයක් බවද පෙනී යයි. 2018.04.19 වන දින මෙම ආයතනයේ සේවකයෙකු විසින් කර්මාන්ත ශාලාවේ පරිපාලන අංශ විසින් ලබාදී ඇති උපදෙස් වලට පටහැනිව කටයුතු කරමින් නොසැලකිලිමත් ලෙස කරන ලද ක්‍රියාවක් හේතුවෙන් අප දියර පිරිපහදු ටැංකියට වැටී ඇති අතර ඔහු බේරා ගැනීමට අපරීක්ෂාකාරී ලෙස නිසි අවසරයකින් තොරව කටයුතු

නිරීමට ක්‍රියා කළ තවත් තැනැත්තන් කිහිප දෙනෙකු එම අනතුරටම ලක්වී ජීවිතක්ෂයට පත්වී ඇති බව අනාවරණය වේ. මෙම අනතුරුදායක ක්‍රියාව කර්මාන්ත ශාලාව තුළ සිදුවූ නොසැලකිලිමත් ක්‍රියාවක් හේතුවෙන් ඇතිවූ හදිසි අනතුරක් බව දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු වන ටී.ජී. හේමචන්ද්‍ර මහතා විසින් ඉදිරිපත් කළ වාර්තා අනුව තහවුරු වේ. නමුත් කර්මාන්ත ශාලාවක් තුළ සිදුවූ නොසැලකිලිමත් ක්‍රියාවක් හේතුවෙන් හට ගත් හදිසි අනතුරක් මත මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම කර්මාන්ත ශාලාවේ පාරිසරික බලපත්‍රය මාස 03 ක පමණ කාලයකට අත්හිටුවා තිබූ බව ද අනාවරණය වේ.

එමෙන්ම හොරණ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ප්‍ර.පො.ප. ප්‍රසන්න වැලිකල මහතා විසින් කර්මාන්ත ශාලාවේ හිමිකරු සහ කළමණාකරු ද අත්අඩංගුවට ගෙන තිබීම අනුව ද සහ අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී කටයුතු කර ඇති ආකාරය තුළින්ද පැමිණිලිකරුට යම් අසාධාරණක් සිදුව තිබේද යන්න වෙත අවධානය යොමු කරන ලදි.

පැමිණිලිකරු තම පැමිණිල්ලට අමුණා ඉදිරිපත් කර ඇති ලේඛන හා ලිඛිත දේශන අනුව පෙන්වා දී ඇති කාරණාවක් වූ කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් නියෝජනය කළ කොමසාරිස්වරුන්ගේ ක්‍රියා කලාපයන් තුළින් ද පැමිණිලිකරු අගතියකට පත්ව තිබේද යන්න වෙත ද අවධානය යොමු කරන ලදි. ඒ අනුව පෙනී යන්නේ කර්මාන්ත ශාලාවේ ක්‍රියා කලාපය පිළිබඳ මාධ්‍ය වෙත වැරදි තොරතුරු ලබාදීමෙන් පැමිණිලිකරුට හා ඔහුගේ කර්මාන්ත ශාලාවට අගති දායක තත්ත්වයක් ඇති වී තිබෙන බවය. වැරදි ක්‍රියා කලාපයක් සිදු කළ කර්මාන්ත ශාලාවක් බව පෙන්වා දීමට දරන ලද උත්සාහයක් ද යන්න පිළිබඳ යම් සාධාරණ සැකයක් පැමිණිලිකරුට ඇතිවී තිබීම යුක්ති සහගත වියහැකි අතර ආයෝජන මණ්ඩලය පිළිගත් කර්මාන්ත ශාලාවේ අනාගත පැවැත්මට ඉත් දැඩි හානියක් සිදුවියහැකි බව ද නිරීක්ෂණය වේ. එකී තොරතුරු මාධ්‍ය වෙත ඉදිරිපත් කිරීමට පෙර දැඩි වගකීමකින් යුතුව කළ යුතුව තිබූ බව පෙන්වා දියයුතු අතර ඒ පිළිබඳ කොමිෂන් සභාවේ දී විභාග කරනු නොලබන්නේ තවදුරටත් ඒ සම්බන්ධව විභාග කිරීමේ හා කරුණු සොයා බැලීමේ වගකීම කම්කරු කොමසාරිස් ජනරාල් හෝ කම්කරු අමාත්‍යාංශයේ ලේකම් විසින් කළයුතු එකක් වන බැවිනි.

ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් කටයුතු කර ඇති ආකාරය තුළින්ද තම මූලික අයිතිවාසිකම් කඩවූ බව පැමිණිලිකරු විසින් පැමිණිල්ල තුළින් දක්වා ඇති අතර ඒ වෙත ද අවධානය යොමු කරන ලදි. නමුත් මෙම වගඋත්තරකරු සම්බන්ධව සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් කරුණු සොයා බැලියයුතු අතර පැමිණිලිකරුට එරෙහිව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් යම් ක්‍රියාවක් කර තිබේනම් ඒ පිළිබඳ කටයුතු සොයා බැලීමට සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ක්‍රියා කළයුතු අතර පැමිණිලිකරු ඔහු වෙත ලිඛිතව වාර්තා කර තිබේනම් හෝ නැතිනම් ඒ පිළිබඳ පැමිණිලි කළ පසු තවදුරටත් ක්‍රියා කිරීම ඔහුගේ වගකීමක් වේ.

2018.04.19 වන දින කර්මාන්ත ශාලාව තුළ සිදුවූ හදිසි අනතුර මත පසු දිනම එනම් 2018.04.20 වන දින මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම කර්මාන්ත ශාලාවේ පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අවලංගු කර තිබෙන බව අනාවරණය වේ. එකී බලපත්‍රය අවලංගු කිරීමට හේතුව වශයෙන් දක්වා ඇත්තේ, අප ජල පිරිපහදු පද්ධතිය ආශ්‍රිතව සිදු කරන ලද යම්කිසි ක්‍රියාකාරකමක් හේතුවෙන් සිදුවූ හදිසි අනතුරට අදාළව අධිකාරියේ නිලධාරීන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණය අනුව බවද දක්වා තිබේ. නමුත් පරීක්ෂණයේදී අනාවරණය වන්නේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙකී පරිසර ආරක්ෂණ බලපත්‍රය කර්මාන්ත ශාලාව

[illegible] සඳහා තිබූ කොන්දේසි කිසිවක් උල්ලංඝනය කර නොමැති බවය. 1988 අංක 56 [illegible] 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ [illegible] යටතේ ප්‍රකාශිත අංක 2034/33, 2034/34, 2034/35, 2024/37 හා 2034/38 දරණ [illegible] 2017.09.01 දිනැති අති විශේෂ ගැසට් නිවේදන වලින් පිළිපැදිය යුතු බවට දක්වා ඇති නියෝග කිසිවක් [illegible] නොතිබියදී මෙම බලපත්‍රය අවලංගු කර ඇති බව පැහැදිලි වේ. ඒ අනුව පරිසර ආරක්ෂණ බලපත්‍රය අවලංගු කිරීමෙන් වසර 23 ක් පමණ වූ කාලයක් තුළ කිසිදු පාරිසරික කොන්දේසියක් කඩ කළ බවට චෝදනාවක් නොලද මෙම කර්මාන්ත ශාලාව මාස 03 ක පමණ වූ කාලයක් ගත වනතුරු කර්මාන්ත ශාලාවේ කටයුතු කර ගෙන යාමට නොහැකි තත්වයකට පත්ව ඇත්තේ මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියා කලාපය අනුව බව පැහැදිලි වේ. පාරිසරික බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීමට හේතුවූ කරුණු මධ්‍යම පරිසර අධිකාරිය විසින් කර්මාන්ත ශාලා හිමිකරු වෙත පැහැදිලිව දක්වා නැති අතර එතෙක් කර්මාන්ත ශාලාව වසා දැමීමට සිදුව ඇති අතර කර්මාන්ත ශාලාවේ දෛනික ආදායම ද සම්පූර්ණයෙන්ම නැවතී තිබී ඇති බව පෙනී යයි. ඉන් කර්මාන්ත ශාලාවට සිදුව ඇති මූල්‍යමය හානිය ද සේවකයින් 60 ක පමණ වූ පිරිසකගේ රැකියා කරගෙන යාමට තිබූ අයිතිවාසිකම ද අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ. පාරිසරික ගැටළුවක් ඇතිවූ අවස්ථාවක් නොවන අවස්ථාවක හා කර්මාන්ත ශාලා හිමිකරු විසින් ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය කර නොතිබියදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් මාස 03ක පමණ වූ කාලයක් ගතවන තුරු ද කර්මාන්ත ශාලාවේ පාරිසරික බලපත්‍රය අත්හිටුවා ඇති බව සනාථ වේ. මෙම කර්මාන්ත ශාලාවේ අනතුරක් සිදුවූ අවස්ථාවේ තාවකාලිකව හෝ පාරිසරික බලපත්‍රය අවලංගු කර තිබුණද පරිසර නිලධාරීන් මගින් කරන ලද පරීක්ෂණයෙන් අනතුරුව කඩිනමින් එකී පරිසර බලපත්‍රය නැවත වලංගු කර දීමට හැකියාව තිබියදී එය නොසලකා හරින ලද බව ද පෙනී යයි. පැමිණිලිකරු දිගින් දිගටම ලිඛිතව ද බලපත්‍රය වලංගු කර දෙන ලෙස ඉල්ලා සිටියද මධ්‍යම පරිසර අධිකාරිය විසින් එය ද නොසලකා හැර ඇති බව පෙනී යයි. පරීක්ෂණයේ දී මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රකාශ කර සිටියේ එකී බලපත්‍රය වලංගු කර දීමට නම් පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් කළයුතු බවය. නමුත් පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් පැමිණි නිලධාරීන් ප්‍රකාශ කර සිටියේ එකී අභියාචනය සළකා බලා බලපත්‍රය නිවැරදි කර දීමට මධ්‍යම පරිසර අධිකාරියට හැකියාවක් ඇති බවය. නමුත් දෙපාර්ශවය විසින් ඉදිරිපත්ව තම වගකීම් හුවමාරු කර ගැනීමට අදාළ නීති තත්ත්වයන් පැහැදිලි කරමින් කටයුතු කිරීම පමණක් සිදු කළ අතර අවශ්‍ය අභියාචනයට අනුව පියවරක් ගෙන නොතිබූ බව ද නිරීක්ෂණය වේ. පැමිණිලිකරුට සිදුවන හානිය හා මූලික අයිතිවාසිකම් කඩවීමකට හේතු වන පරිදි කටයුතු සිදු වෙමින් පවතින බව පැහැදිලි කර දුන් පසු එකී බලපත්‍රය පැමිණිලිකරුට නැවත ලබාදී කර්මාන්ත ශාලාව පවත්වාගෙන යාමට ඉඩ ලබා දුන්නද ඒ වනවට කර්මාන්ත ශාලාව මාස 03ක පමණ වූ කාලයක් වසා දැමීමට සිදුවන ලද්දේ ද මෙම වගඋත්තරකරුවන්ගේ විෂය පථයට අදාළ නොවන ක්‍රියාකාරකම් හේතුවෙන් බව ද නිරීක්ෂණය වේ.

මෙම කර්මාන්ත ශාලාවේ ඇතිවූ සිද්ධියට සති 02කට පමණ පෙර දඹුල්ල ප්‍රදේශයේ Bio Foods නම් වූ කුළුබඩු නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක විෂ වායුවක් ආශ්‍රහණය වීමෙන් සේවකයින් දෙදෙනෙකු එම ස්ථානයේම ජීවිතක්ෂයට පත් වූ බවට කරුණු අනාවරණය වන අතර එහිදී එකී කර්මාන්ත ශාලාවේ පාරිසරික බලපත්‍රය අවලංගු කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් කටයුතු කර නොමැති බව ද අනාවරණය වේ. ඒ අනුව පැමිණිලිකරුට එරෙහිව එක් ආකාරයකටත් වෙනත් කර්මාන්ත ශාලා හිමිකරුවන් සම්බන්ධයෙන් තවත් ආකාරයකටත් මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කර තිබෙන බව පෙනී යන අතර නීතිය සැමට සර්ව සාධාරණව හා වෙනස් කොට සැළකීමකට ලක් කිරීමකින් තොරව භාවිතා

කළයුතුය යන සිද්ධාන්තය මධ්‍යම පරිසර අධිකාරිය විසින් උල්ලංඝනය කර ඇති බව ද නිරීක්ෂණය වේ. මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2009 වර්ෂයේ දී ද පැමිණිලිකරුට සිදු කළ යම් අසාධාරණයකට එරෙහිව මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව නඩු පවරා තිබී ඇති බව ද පැමිණිලිකරු පරීක්ෂණ අවස්ථාවේ පෙන්වා දෙන අතර එසේ තිබියදී තමාට එරෙහිව මෙම අවස්ථාවේදී අසාධාරණ තීරණයක් ගැනීමට මූලික හේතුවක් වී ඇත්තේ ද ඉහත කී නඩුවේ කටයුතු වියහැකි බවට පැමිණිලිකරු අදහස් කිරීම සාධාරණ සැකයක් ඔහු තුළ ඇති කිරීමට හේතු වී තිබියහැකි බව ද පෙන්වා දිය යුතු ය.

හොරණ මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපතිව සිටි ප්‍ර.පො.ප.ප්‍රසන්න වැලිකල මහතා විසින් කටයුතු කර ඇති ආකාරය හා පසුව ක්‍රියා කර ඇති ආකාරය අනුව ද පැමිණිලිකරු හිංසනයකට හා මූලික අයිතිවාසිකම් කඩවීමකට ලක්ව තිබෙන බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු පෙන්වා දී ඇත්තේ 2016 වසරේ දී මෙම ප්‍රදේශයේ පදිංචි දේශපාලනඥයකු විසින් තම ආයතනය වෙතින් කප්පම් මුදල් ලබාදෙන ලෙසට කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර පැමිණිලිකරු සහ කර්මාන්ත ශාලාවේ කළමණාකරණ මණ්ඩලය විසින් හොරණ පොලිසිය වෙත පැමිණිල්ලක් සිදු කර තිබුණු බව ද එකී පැමිණිල්ලට සාධාරණ විමර්ශනයක් පොලිසිය විසින් සිදු නොකළ බැවින් පොලිස් මූලස්ථානයට නැවත පැමිණිලි කර තිබූ බව ද ඒ අනුව හොරණ පොලිසියේ නිලධාරීන් විසින් ඇති කරගන්නා ලද අමනාපකම මෙම අවස්ථාවේ දී පැමිණිලිකරුට සහ කර්මාන්ත ශාලාවට එරෙහිව කටයුතු කිරීමට හේතුවක් වූ බවය. ඒ පිළිබඳ කරුණු තහවුරු කර ගැනීම විසඳියයුතු කරුණක් ලෙස පරීක්ෂණ අවස්ථාවේ හඳුනා නොගත් නමුත් පැමිණිලිකරු ඒ බවට කළ ප්‍රකාශයක් ද පැමිණිල්ලේ ඇති බව පෙන්වා දියයුතු ය. පොලිසිය විසින් මෙම අනතුර සිදුවූ පසු කර්මාන්ත ශාලාවේ කළමණාකරු වන ඒ.කේ.ඩී.ආර්.එදිරිසිංහ මහතා අත්අඩංගුවට ගෙන ඇති අතර පොලිස් සිර මැදිරියේ ඔහු රඳවා තිබියදී ඒ වෙත කිහිප වරක් පැමිණි පො.ප.ඉන්දික යන අය සහ නම හඳුනාගත නොහැකි වූ කා.උ.පො.ප. වරියක් ද මානසිකව හිංසාවක් සිදුවන ආකාරයට ප්‍රකාශයන් කරමින් හැසිරී ඇති බව කළමණාකරු විසින් පැමිණිලිකරුට ප්‍රකාශ කර තිබෙන බව පැමිණිල්ල තුළින් දක්වා තිබේ. පොලිසිය විසින් අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී බී වාර්තාව තුළින් දක්වා ඇත්තේ පැමිණිලිකරු අධිකරණය නොමග යවන ලද බව ය. අධිකරණයට කරුණු වාර්තා කර ඇති ආකාරය අනුව අපරාධයක් සිදු කළ බවට හැඟී යන ආකාරයේ බී වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව එහි ඇති කරුණු වෙත අවධානය යොමු කිරීමේදී පැහැදිලි වේ. මෙකී ක්‍රියාවන් හේතුවෙන් ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලත් තම කර්මාන්ත ශාලාවේ පැවැත්මට දැඩි බලපෑමක් ඉන් සිදු වූ බවට පැමිණිලිකරු කරන ප්‍රකාශය පිළිගතහැකි එකක් බව පෙන්වා දියයුතු අතර පැමිණිලිකරු මානසික හිංසනයට ලක්ව ඇති බව ද පෙනී යන්නේ පැමිණිලිකරු පසු කාලීනව මානසික ආතතිය හේතුවෙන් ප්‍රතිකාර ගත් බවට කරුණු පෙන්වා දීම අනුව ය.

හොරණ මහේස්ත්‍රාත් අධිකරණයට නඩු අංක: 34964/18 යටතේ මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් කරුණු වාර්තා කර ඇති ආකාරය අනුව ඇත්තේ කර්මාන්ත ශාලාවේ විෂ අපද්‍රව්‍ය වළකට වැටී පුද්ගලයින් තුවාල ලබා රෝහල් ගත කර ඇති බව ද ඒ අනුව පුද්ගලයින් මිය යාම සම්බන්ධව අධිකරණයට කරුණු වාර්තා කරන බව ය. මෙම රබර් කර්මාන්ත ශාලාවේ අපද්‍රව්‍ය බැහැර කරන ඇමෝනියා වළ නමින් හඳුන්වන වළකට එහි සේවකයින් කිහිප දෙනෙකු වැටී ඇති බවට 119 දුරකථන මගින් ස්ථානාධිපති වෙත ලද දැනුම් දීම මත නිලධාරීන් කණ්ඩායමක් සමග කර්මාන්ත ශාලාවට පරීක්ෂණයට පිවිසි බව ද ඉන් දක්වා තිබේ. පොලිසිය එම ස්ථානයට පිවිසි අවස්ථාවේ වළට වැටුණු සේවකයින් රෝහල් ගත කර ඇති බව ද මෙම සිදුවීම කෙසේ සිදුවී ද යන්න පිළිබඳව වැඩිදුර පරීක්ෂණ

සිදු කරන බව ද 2018.04.19 වන දින අධිකරණයට වාර්තා කර ඇත. 2018.04.20 දින වැඩිදුර කරුණු වාර්තා කරමින් මෙම අපරාධයේදී මියගිය තැනැත්තන් සම්බන්ධව මරණ පරීක්ෂණ පැවැත්වීම සඳහා නියෝග ලබාගැනීමට ද අත්අඩංගුවට ගත් කළමණාකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට එදින කටයුතු කරන බව ද දක්වා තිබේ.

මෙහිදී අපරාධය යන්න සහ අත්අඩංගුවට ගත් බව යන ප්‍රකාශ අනුව පෙනී යන්නේ මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් මහේස්ත්‍රාත් වරයා වෙත කරුණු වාර්තා කිරීමේදී අපරාධයක් ලෙස මෙම සිදුවීම හඳුන්වා දී ඇති බව ය. මෙම අවස්ථාවේ ආයතනයේ කළමණාකරු අත්අඩංගුවට ගැනීම අත්තනෝමතික ද යන්න සොයා බැලිය යුතුය. ඒ අනුව මෙම කාර්මික අනතුර අපරාධයක් ලෙස හැඳින්වීම නිවැරදි ද යන්න ද නිරීක්ෂණය කළ යුතු ය. එකී කරුණු අනුව පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුව තිබේද යන්න නිගමනය කළයුතු ය.

වැඩිදුර කරුණු වාර්තා කරමින් මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් එකී වාර්තා තුළින් අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමේදී සැම විටම මෙම කාර්මික අනතුර අපරාධය යන වචනය භාවිතා කරමින් දක්වා ඇති බව නඩු වාර්තා පරීක්ෂා කිරීමේදී පෙනී යයි. තවද කරුණු අධිකරණයට වාර්තා කිරීමේදී පොලිසිය විසින් කර්මාන්ත ශාලාවේ ස්වභාවය අනාරක්ෂිත බව පෙන්වීමට කටයුතු කර ඇති බව ද හඳුනාගත හැක. එනම්, හදිසි ආපදා අවස්ථාවකදී ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සේවකයින් සහ අවට ජනතාව දැනුවත් කර නොමැති බව දක්වා තිබීම ද කළමණාකාරීත්වය හා පාලන අධිකාරිය විසින් අනතුරක් වළක්වා ගැනීමට කිසිදු උත්සාහයක් ගෙන නොමැති බව ද විමර්ශන වලින් අනාවරණය වී ඇති බව අධිකරණයට දක්වා තිබේ. අනතුරට පත් වූයේ සේවකයින් දෙදෙනෙකු බව ද ඔවුන් මුදවා ගැනීමට පැමිණි තවත් තිදෙනෙකු අනතුරට පත් වූ බව ද බී වාර්තාව තුළින් පැහැදිලි වේ.

අනතුර සිදුවූ ස්ථානයට නිසි අවසරයකින් තොරව ඇතුළුවී තවදුරටත් අපරීක්ෂාකාරී ලෙස හැසිරෙමින් බාහිර පුද්ගලයින් ද එම අනතුරට පත්වීම කර්මාන්ත ශාලාවේ වගකීමක් බවට දක්වා තිබීම සාධාරණ නොවන බව පෙන්වා දියයුතුය. එමෙන්ම කර්මාන්ත ශාලාවේ හිමිකරු කොළඹ 07, ලොන්ඩන් පෙදෙස, අංක 30/90/ඩී දරණ ස්ථානයේ පදිංචි බව ද අනතුර වූ අවස්ථාවේ කර්මාන්ත ශාලාවෙන් පලා ගොස් ඇති බවට පරීක්ෂණ වලින් අනාවරණය වූ බවට පොලිසිය අධිකරණයට දක්වා ඇත්තේ සත්‍ය තොරතුරු නොවන බව පෙනී යයි. මෙම පැමිණිල්ල ගොනු කරන කර්මාන්ත ශාලාවේ හිමිකරු වන කේ.ඩී.සරත් විජේරත්න යන අය මෙම අනතුර සිදුවන අවස්ථාවේ කර්මාන්ත ශාලාවේ සිටි බව ද කඩිනමින් අනතුරට පත්වූවන් කර්මාන්ත ශාලාවට කැඳවා ගත් ගිලන් රථ මගින් රෝහල් ගත වීමට කඩිනම් උත්සාහ දරණ බව තම සී.සී.ටී.වී. දර්ශන තුළ ඇති ඡායාරූප මගින් පරීක්ෂණ අවස්ථා වලදී පෙන්වා දී තිබිණ. ප්‍රදේශ වාසීන් විසින් කර්මාන්ත ශාලාවට හා හිමිකරුට අනතුරක් කිරීමට ඇති අවස්ථාව පවා නොතකා එසේ කටයුතු කර ඔහු විසින් ක්‍රියාත්මක කර තිබියදී ඔහු පලා ගොස් ඇති බවට කරුණු දක්වා අධිකරණයට සාවද්‍ය තොරතුරු "බී" වාර්තාව තුළින් ඉදිරිපත් කර ඇති බව පෙනී යයි. අනාරක්ෂිත කර්මාන්ත ශාලාවක් බව පෙන්වීමට පොලිසිය බී වාර්තාවේ කරුණු තුළින් උත්සාහ දරණ ලද නමුත් කිසිදු අවස්ථාවක මෙම කර්මාන්ත ශාලාව අනාරක්ෂිත බවට දිස්ත්‍රික් කර්මාන්ත ඉංජිනේරු විසින් වාර්තා කර නොමැති බව වාර්තා වේ. එමෙන්ම මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම කර්මාන්ත ශාලාවේ ආරම්භක අවස්ථාවේ සිට අනතුර වූ අවස්ථාව දක්වා කිසිදු අවස්ථාවක පාරිසරික කොන්දේසි කඩ කළ ආයතනයක් බවට දක්වා තිබී නැති බව පෙනී යයි.

කර්මාන්ත ශාලාවේ පරිපාලන හා කළමණාකරණ අධ්‍යක්ෂ ලෙස සේවය කළ රත්නසිරි ඉදිරිසිංහ යන අය අත්අඩංගුවට ගෙන ඇත්තේ අධිකරණය විසින් දෙන ලද නියෝගයකින් තොරව බව ද පෙනී යයි. ඔහු තම ප්‍රකාශය ලබාදෙමින් පොලිසිය වෙත කියා ඇත්තේ අපද්‍රව්‍ය තැන්පත් කරනු ලබන ටැංකි වලට තමාගේ අනුදැනුමකින් තොරව ලබාදී ඇති නිසි උපදෙස් හා ක්‍රමවේද වලින් බැහැරව කටයුතු කිරීම හේතුවෙන් සේවකයින් දෙදෙනෙකු අනතුරට පත්වීම ද කිසිදු අවසරයකින් තොරව පිටස්තර තැනැත්තන් තිදෙනෙකු පැමිණ අනවශ්‍ය ලෙස මැදිහත්ව කටයුතු කිරීමෙන් ද මෙම අනතුර සිදුව ඇති බවය. නමුත් කළමණාකරු අත්අඩංගුවට ගෙන මෙම අනතුරට ලක් වූවන් සම්බන්ධව කළමණාකරු ද හිමිකරු ද සෘජුවම වගකිවයුතු බවට පොලිසිය විසින් කරුණු දක්වා ඇති අතර ඒ අනුව මහේස්ත්‍රාත් වරයා වෙත දක්වා ඇත්තේ කර්මාන්ත ශාලාවේ හිමිකරු වන සරත් විජේරත්න යන අය ප්‍රදේශය හැර පලා ගොස් ඇති බව ද අත්අඩංගුවට ගැනීමට කටයුතු කරමින් සිටින බව ය. නමුත් මෙම පැමිණිලිකරු කර්මාන්ත ශාලාවේ හිමිකරු වන අතර ඔහු හොරණ පිහිටි තම කර්මාන්ත ශාලාවේ පදිංචියක් නොමැති අතර පදිංචිව සිටින්නේ කොළඹ 07. ලොන්ඩන් පෙදෙස හි පිහිටි තම නිවසේ බැවින් එලෙස තම නිවස බලා පැමිණ සිටීම ප්‍රදේශය හැර පලා ගොස් ඇති බවට පොලිසිය විසින් අධිකරණයට කරුණු දැක්වීම සහේතුක නොවන බව පෙනී යයි. එමෙන්ම මෙම පැමිණිලිකරු කර්මාන්ත ශාලාවේ රැඳී නොසිට පලා ගිය බව අනාවරණය නොවන බව ද පෙන්වා දිය යුතුය. එමෙන්ම අත්අඩංගුවට ගත් මෙම කර්මාන්ත ශාලාවේ කළමණාකරුට ඇප ලබාදීමට විරුද්ධව අධිකරණයට කරුණු දක්වා ඇති බව ද පෙනී යයි. තවද අත්අඩංගුවට ගැනීමට ඇති සැකකරුවන් ඇති බව ද දක්වා සිටීමෙන් පෙනී යන්නේ කර්මාන්ත ශාලාවේ හිමිකරු ද අත්අඩංගුවට ගැනීමට පොලිසිය ක්‍රියා කරමින් සිටි බවය. එනම් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියක නියැලීමට මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් වෙර දරමින් සිටි බව පෙනී යයි. මෙය එක් ආකාරයකට සලකා බැලීමේදී අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමට දරනු ලබන උත්සාහයක් ලෙස ද නිරීක්ෂණය වන අතර ඊට හේතුව වන්නේ යම් කර්මාන්ත ශාලාවක් තුළ කාර්මික අනතුරක් සිදුවූ අවස්ථාවකදී කර්මාන්ත ශාලාවේ හිමිකරු සොයා ගොස් අත්අඩංගුවට ගැනීම සාධාරණ අත්අඩංගුවට ගැනීමක් ලෙස හඳුන්වා දිය නොහැකි බැවිනි. අත්අඩංගුවට ගත් කළමණාකරු ද රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස ද ඉල්ලීමක් අධිකරණයට කර ඇති බව වාර්තා අනුව පැහැදිලි වේ. එමෙන්ම වැඩිදුර තොරතුරු දැනගැනීමට හෝ අවශ්‍ය බවට දක්වා මෙම කර්මාන්ත ශාලාවේ රසායනාගාර පාලිකා ශිල්පිනිය වන ඉනෝකා යන අය ද පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ. මෙහිදී කර්මාන්ත ශාලා හිමිකරු අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාවය සඳහා පොලිසිය විසින් චේතනාන්විතවම කටයුතු කර ඇති බව අදාළ බී වාර්තා පරීක්ෂා කිරීමේදී පැහැදිලි වේ.

තවද කර්මාන්ත ශාලාවේ හිමිකරු හෝ කළමණාකාරීත්වය විසින් හිතාමතා කරන ලද ක්‍රියාවක් නොවන ක්‍රියාවක් සිදුව නොමැති බව පෙනී යන අතර කර්මාන්ත ශාලාවේ සේවකයෙකු විසින් උපකරණයක් භාවිතා කිරීමට ලබා දී තිබූ උපදෙස් වලින් පරිබාහිරව කරන ලද ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම අනතුර සිදුව ඇති බව ද සියළු වාර්තා පරීක්ෂා කිරීමේදී පෙනී යයි. එමෙන්ම කර්මාන්ත ශාලාව වටා සහ එම අප ජලය සහිත ටැංකිය පිහිටි ස්ථානයට ඇතුල් වීම තහනම් කළ පුවරු සවි කර තිබියදී ඒ පිළිබඳ නොසළකා හරිමින් මෙම අනතුර පිළිබඳ කරුණු සැළ වූ වහා ප්‍රදේශ වාසීන් දිව විත් අනතුරට ලක් වූ අය බේරා ගැනීමට තැත් කිරීමෙන් අනතුරු දායක ස්වභාවය තවදුරටත් වර්ධනය වී ඇති බව පෙනී යයි. එකී ක්‍රියාවන් ක්ෂණිකව වැළැක්වීමේ හැකියාවක් පාලන අධිකාරියට එවැනි හදිසි අවස්ථාවක නොමැති බව ද නිරීක්ෂණය වේ. කර්මාන්ත ශාලා හිමිකරු විදේශ ගතවීම වැළැක්වීමට පවා කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් පොලිසියට තිබී ඇති බව ඔවුන් අධිකරණයට ඉදිරිපත් කළ කරුණු අනුව පෙනී යයි.

මහේස්ත්‍රාත් විසින් ඇප පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ඇප ලබාදීමට ඇති හැකියාව තිබියදී පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කළ බී වාර්තා වෙත අවධානය යොමු කර පැමිණිලිකරු හා කර්මාන්ත ශාලාවේ කලමණාකරු ද රසායනාගාර පාලිකාව ද රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කටයුතු කර ඇති අතර ඊට හේතුව වන්නේ පොලිසිය විසින් කළ කරුණු ඉදිරිපත් කිරීමේ ස්වභාවය හා ඇප ලබාදීමට එරෙහිව කරුණු දක්වා තිබීම බව ද නිරීක්ෂණය වේ. ඇප ලබා දෙන ලද්දේ නම් මහජන සාමය කඩ වීමේ තත්ත්වයක් ඇතිවියහැකි බවට පොලිසිය විසින් වාර්තා කර තිබුණද හොරණ ප්‍රදේශයේ පිහිටි මෙම කර්මාන්ත ශාලාවේ සිදුවූ සිදුවීමට අදාළව කොළඹ 07 ලොන්ඩන් පෙදෙසේ පිහිටි තම නිවසේ පදිංචි මෙම පෙත්සම්කාර කර්මාන්ත ශාලා හිමිකරුට එරෙහිව සාමය කඩවීමේ තත්ත්වයක් හට ගන්නේ කෙසේද යන්න පිළිබඳ ගැටළුවක් මතු වේ. කෙසේ වෙතත් පැමිණිලිකරුගේ නීතිඥ වරුන් විසින් කර්මාන්ත ශාලා හිමිකරු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවට කරුණු පැහැදිලිව දක්වා තිබියදී මහේස්ත්‍රාත් විසින් ඒ වෙත අවධානයක් යොමු කරන ලද්දේ නම් තමාට එරෙහිව තවදුරටත් සිදු වෙමින් පැවති මානසික හිංසනය අවම කර ගතහැකිව තිබූ බවට දක්වා තිබූ කරුණු තවදුරටත් කොමිෂන් සභාවේදී සලකා බැලියහැකි නොවන්නේ පැමිණිලිකරුට ඒ පිළිබඳ තවදුරටත් අවශ්‍ය වන්නේ නම් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත කරුණු පැහැදිලි කර දියහැකි බැවිනි. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පැමිණිලිකරුට අධිකරණයේදී අගතියක් සිදුව තිබේනම් ඒ පිළිබඳ සුදුසු පරීක්ෂණයකින් අනතුරුව සාධාරණ හා යුක්ති සහගත තීරණයක් ගතහැකි බව දැක්විය යුතු ය.

මින් පෙර කර්මාන්ත ශාලා සම්බන්ධ අනතුරු වලදී කර්මාන්තශාලා හිමිකරුවන් සොයා ගොස් ඔවුන් අත්අඩංගුවට ගත් අවස්ථා නොමැති බවට පරීක්ෂණ අවස්ථා වලදී හඳුනා ගත් කර්මාන්ත අනතුරු සම්බන්ධව ඉදිරිපත් වූ නඩු කටයුතු පිළිබඳ සොයා බැලීමේදී අනාවරණය වේ. එබැවින් මෙම අවස්ථාවේ වගඋත්තරකාර මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් මෙම කර්මාන්ත ශාලාවේ කලමණාකරු සහ රසායනාගාර පාලිකා ශිල්පිනී අත්අඩංගුවට ගෙන ඇත්තේ ඔවුන් විසින් කරන ලද අපරාධමය ක්‍රියාවක් හේතුකොටගෙන නොවන බව පෙනී යන අතර කර්මාන්තශාලා හිමිකරු අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය බවට අධිකරණයට කරුණු වාර්තා කරන්නේ කුමන හේතුවක් මතද යන්න පැහැදිලි නොවේ. මෙම කර්මාන්ත ශාලාව වසර 23ක් පමණ වූ කාලයක සිට කිසිදු කාර්මික අනතුරකින් තොරව පවත්වාගෙන යන ලද එකක් බව පැමිණිලිකරු ප්‍රකාශ කර ඇති අතර මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබාදෙන ලද වාර්තා ද දිස්ත්‍රික් කර්මාන්ත ඉංජිනේරුවරයාගේ වාර්තාවෙන් ද මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබාදී ඇති පරිසර ආරක්ෂණ බලපත්‍රය කලින් කලට දීර්ඝ කිරීමෙන් ද ඒ බව පැහැදිලිවේ. ඒ අනුව සලකා බැලීමේදී හොරණ මූලස්ථාන පොලිසිය විසින් මෙම සිදුවීමට අදාළව කරුණු විභාග කිරීමේදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 115(1). (2). (3). (4). 120(1). (2). (3) යටතේ වරදක් විමර්ශනය කිරීමේ කටයුතු පිළිබඳ ඇති බලතල ප්‍රකාරව සාධාරණත්වයකින් යුතුව සිදු නොකිරීමෙන් ක්‍රියා කර ඇති බව ද නිරීක්ෂණය වේ. ඉන් 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 ව්‍යවස්ථාව උල්ලංඝනය වීමට කරුණු යෙදී ඇති බව පැහැදිලි වේ.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2018.04.19 දින ප්‍රසිද්ධ මාධ්‍ය ජාල ඔස්සේ අදහස් පළ කිරීමේදී කටයුතු කර ඇති ආකාරය පිළිබඳව පැමිණිලිකරු කරුණු ඉදිරිපත් කරමින් ඉන් තම කර්මාන්ත ශාලාවට සිදුවූ අගතිය පිළිබඳව දක්වා ඇති අතර ඉන් ආයතන සංග්‍රහයේ නීති රීති ද උල්ලංඝනය කරන බව දක්වා ඇතත් මේ පිළිබඳව කරුණු සොයා බලා නීතියට පටහැනි ආකාරයේ ක්‍රියාවක් හෝ මාධ්‍යයට කරුණු දැක්වීමක් සිදුව තිබේනම් කම්කරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධව අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් පරීක්ෂණයක් සිදු කර පියවර ගතයුතු බව පෙන්වා දියයුතුය. එමෙන්ම කම්කරු කොමසාරිස්

ජනරාල්ගේ උපදෙස් මත තවත් නිලධාරීන් විසින් දිස්ත්‍රික් කර්මාන්ත ඉංජිනේරු වරයා හට බලපෑම් කරන බවටද පරීක්ෂණ පවතින අතරතුර කොමිෂන් සභාව වෙත වාර්තා ලබා දීමෙන් ද පෙනී යන්නේ කළුතර දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු මහතා විසින් කර්මාන්ත ශාලාව පරීක්ෂා කර බලා නිවැරදිව ඉදිරිපත් කර සිටින සහ නීත්‍යානුකූලව කරනු ලබන කටයුතු වැළැක්වීමට ද ඊට එරෙහිව එකී ඉංජිනේරු මහතාට තර්ජනය කිරීමට හෝ බලපෑම් කිරීමට ද කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් කටයුතු කර ඇති බවය. දැඩි බලපෑම් මධ්‍යයේ වුවද කළුතර දිස්ත්‍රික් කර්මාන්ත ඉංජිනේරු විසින් නීත්‍යානුකූලව සිදු කළ පරීක්ෂණයේ වාර්තා හා කරුණු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා කර තිබීම ද හඳුනාගත හැකි කාරණාවක් වන අතර මෙහිදී කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු වරයාට සිදුව ඇති දැඩි බලපෑම් තර්ජන හා ඔහුගේ වෘත්තියට එරෙහිව තවදුරටත් මේ හේතුව මත සිදුවියහැකි අවධානම් තත්ත්වය පිළිබඳව කම්කරු අමාත්‍යාංශයේ ලේකම් වරයා විසින් පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය තීරණය ගත යුතු බව පෙන්වා දියයුතුය.

අප ජලය ඉවත් කිරීමට යොදා ගැනෙන ටැංකි වගඋත්තරකරුවන් විසින් හඳුන්වන්නේ ඇමෝනියා වළ ලෙස වුව ද එවැනි නම් කළ වළක් මෙම කර්මාන්ත ශාලාවේ නොමැති බව පෙනී යයි. ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ අනුමත අප දියර පිරිසිදු කිරීමේ පද්ධතියක් මෙම කර්මාන්ත ශාලාවේ සකසා ඇති අතර එම පද්ධතිය මාස 03කට වරක් පරීක්ෂා කර විශ්ලේෂණ වාර්තා ලබා ගනිමින් පවත්වාගෙන ගොස් ඇති බව පැමිණිලිකරු ඒ බව තහවුරු කිරීමට පැමිණිල්ල සමග අමුණා ඇති ලේඛන අනුව අනාවරණය වේ. ඒ අනුව ඇමෝනියා වළක් නොව අප ජලය පිරිපහදු පද්ධතියේ කොටසක් ලෙස අප ජල ටැංකියක් භූගතව පවතින බව පෙනී යන අතර වගඋත්තරකාර පොලිස් ඒකකයට ඇමෝනියා වළ ලෙස අධිකරණයට හඳුන්වා දී ඇති බවද පෙනී යයි. ඒ අනුව පොලිස් ස්ථානය විසින් කරුණු සොයා බැලීමකින් තොරව ඇමෝනියා වළ ලෙස මෙම ස්ථානය දක්වා කරුණු වාර්තා කිරීමෙන් නිවැරදි අවබෝධයක් අධිකරණයට ඇති කර ගැනීමට නොහැකි වන තත්ත්වයක් ද තිබෙන බව නිරීක්ෂණය වේ. තවද කර්මාන්ත ශාලාවේ දොරටුවේ ඇතුල් වීම තහනම් යන පුවරුවක් තිබියදී එය ද නොතකා හරිමින් නිසි අවසරයකින් ද තොරව ගම් වැසියන් මෙම අනතුර වූ ස්ථානයට ඇතුල් වන්නේ බලහත්කාරයෙන් බව පෙනී යයි. එය මෙම කර්මාන්ත ශාලාවේ අනතුරට පත් දෙදෙනා ඉක්මවා තවදුරටත් අනතුරු දායක මරණ 03ක් ඇතිවීමට හේතු වී තිබෙන බව අනාවරණය වේ. වසර 25කට ආසන්න කාලයක් මෙම කර්මාන්ත ශාලාව කිසිදු කාර්මික අනතුරක් ඇති කර නොගනිමින් ක්‍රියාත්මක වී ඇති බව පෙනී යන අතර මෙම අවස්ථාවේ කාර්මික අනතුරක් සිදුවීමට හේතු වී ඇත්තේ ද එකී අප ජල ටැංකිය ක්‍රියාත්මක කිරීමට අදාළ තාක්ෂණික උපකරණ හෝ උපදෙස් අදාළ සේවකයා විසින් නිසි ලෙස පිළි නොපැදීමෙන් බවද අනාවරණය වේ. ඒ බව ජ්‍යෙෂ්ඨ රසායනාගාර නිලධාරිනී ඉනෝකා සංජීවනී වැලිකල මිය සහ කර්මාන්ත ශාලාවේ අධ්‍යක්ෂ, පාලන හා කළමණාකාර, සුමිත් එදිරිසිංහ මහතාගේ ප්‍රකාශ අනුව පෙනී යයි.

එමෙන්ම මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් පැමිණිලිකරු සිද්ධිය වූ අවස්ථාවේ එම ස්ථානයෙන් පලා ගිය බවට චෝදනා කර ඔහු පොලීසිය සහ අධිකරණය මග හරිමින් සිටින බව ද අනතුරට පත් පුද්ගලයින්ට උපකාරයක් නොකළ බවටද චෝදනා කර තිබීම නිවැරදි නොවන බව පැමිණිල්ලේ සියළු කරුණු සළකා බැලීමේදී පෙනී යන කාරණාවක් වේ. ගිලන් රථ මගින් අනතුරට පත් සේවකයින් රෝහල් කරා පිටත් කර හරින තුරු පැමිණිලිකාර කර්මාන්ත ශාලා හිමිකරු රැඳී සිට ඇති අතර කර්මාන්ත ශාලාවට බාහිර පුද්ගලයින් ඇතුළු වී සාමය කඩ වන පරිදි හැසිරීමට බොහෝ දුරට ඉඩකඩ තිබූ බැවින් කර්මාන්ත ශාලාවේ කළමණාකාරිත්වයේ ඉල්ලීම මත ජීවිත ආරක්ෂාව පතා එම ස්ථානයෙන් ඉවත්ව සිටීම පොලීසිය සහ අධිකරණය මගහැර පලා යාමක් ලෙස දැක්වීම වැරදි අර්ථ නිරූපණයක් බව පෙන්වා දියයුතුය. යම්

කිසි ආකාරයකට පැමිණිලිකරු රැඳී සිටියානම් කෝපයට පත් ප්‍රදේශ වාසීන් කර්මාන්ත ශාලා හිමිකරුට එරෙහිව අපරාධමය ක්‍රියාවක් වුවද සිදු කිරීමට ඉඩ තිබුණු බව පැහැදිලි වේ.

මෙම අවස්ථාවේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් කර්මාන්ත ශාලාවේ බලපත්‍රය තාවකාලිකව හෝ අවලංගු කරනු ලබන්නේ පාරිසරික කොන්දේසි හා සම්බන්ධ ගැටළුවක් නොතිබියදී ඔවුන්ගේ විෂය පථයට අදාළ නොවන කාරණාවක් වෙනුවෙන් බව නිරීක්ෂණය වේ. මුල් අවස්ථාවේ පරිසර අධිකාරියේ නිලධාරීන් මෙම ස්ථානයට පැමිණ කරුණු පරීක්ෂා කිරීමෙන් පසු පාරිසරික අයිතිවාසිකමක් උල්ලංඝනය වී නොමැති බව හඳුනා ගැනීමට ප්‍රමාණවත් පරීක්ෂණයක් එසේ සිදු කර තිබියදී තවදුරටත් මෙම කර්මාන්ත ශාලාවේ බලපත්‍රය අවලංගු කර තැබීමට ක්‍රියා කර ඇත. මෙම අනතුර සිදුවූ දිනට සති දෙකකට පමණ පෙර දඹුල්ල ප්‍රදේශයේ Bio Foods නමින් හඳුන්වන කුළු බඩු නිෂ්පාදනය කරනු ලබන කර්මාන්ත ශාලාවක විෂ වායුවක් ආශ්‍රහණය වීමෙන් සේවකයින් දෙදෙනෙකු එම කර්මාන්ත ශාලාව තුළම ජීවිතක්ෂයට පත් වී තිබුණද එකී කර්මාන්ත ශාලාවේ බලපත්‍රය අවලංගු නොකර තැබීමෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් තමාට පමණක් වෙනත් ආකාරයකට නීතිය වෙනස් කොට සළකමින් ක්‍රියා කර ඇති බව පැමිණිලිකරු විසින් පෙන්වා දීම ද විශේෂ කාරණාවකි.

පැමිණිලිකරු විසින් පෙන්වා දෙන තවත් කාරණාවක් වූ, 2016 වසරේදී පමණ තම කර්මාන්ත ශාලාව පිහිටි ප්‍රදේශයේ ක්‍රියා කළ ප්‍රසිද්ධ දේශපාලඥයකු විසින් ඔහුට කප්පම් මුදල් ඉල්ලා සිටියදී එය ලබා නොදීමෙන් සිදු කරන ලද මරණීය තර්ජන වලට එරෙහිව හොරණ පොලිස් ස්ථානය වෙත කළ පැමිණිල්ලක් සාධාරණව විභාග නොකිරීමේ හේතුව මත තමා පොලිස් මූලස්ථානයට පැමිණිලි කර තිබීම පොලිසිය විසින් ද තම කර්මාන්ත ශාලාවට එරෙහිව ද්වේශ සහගතව කටයුතු කිරීමට හේතුවක් තිබෙන බව පෙන්වා දීම මෙහිදී නිරීක්ෂණය වූ තවත් අමතර කාරණාවකි. ඒ අනුව පොලිසිය විසින් තම කර්මාන්ත ශාලාවේ කළමණාකරු අත්අඩංගුවට ගත් පසු පොලිස් සිර මැදිරිය වෙත කිහිප වරක් පැමිණි පොලිස් පරීක්ෂක. ඉන්දික මහතා සහ තවත් කාන්තා උප පොලිස් පරීක්ෂක වරියක් විසින් තම කළමණාකරුට මානසිකව හිංසාවක් වන ආකාරයට කළා වූ ප්‍රකාශයන් හේතුවෙන් තමා ද හිංසනයකට භාජනය විය හැකි බැවින් අවශ්‍ය වන්නේ නම් අධිකරණයට ඉදිරිපත් වීමට සූදානමින් සිටි බව පැමිණිලිකරු පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ ලේඛන අනුව දක්වා ඇති අතර පසුව තම නීතිඥ වරුන් මගින් අධිකරණය වෙත ඉදිරිපත් වුවද පොලිසිය විසින් අධිකරණයට එතෙක් සැල කර තිබූ කරුණු අනුව කර්මාන්ත ශාලාවේ හිමිකරු ලෙස අයිතිය දැරීමේ හේතුව මතම පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට මහේස්ත්‍රාත් වරයා විසින් කටයුතු කර ඇති බව පෙන්වා දී තිබේ. මෙම කර්මාන්ත ශාලාවේ කාර්මික අනතුර සිදුවී යම් කාලයක් ඉක්මවා ගොස් තිබියදී හා සාමකාමී පරිසරයක් ප්‍රදේශයේ ඇති වී තිබියදී පසු කාලීනව අධිකරණයට ඉදිරිපත්වූ පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් ඔහුගේ නිදහස අහිමි වීමට කරුණු යෙදී ඇති අතර ඊට හේතුව වී ඇත්තේ පොලිසිය විසින් එතෙක් අධිකරණයට ඉදිරිපත් කළ පෙර කී කරුණු අධිකරණයේ සැළකිල්ලට ගෙන ඇති බැවින් බව පෙනී යන අතර ඇප පනතේ බලතල යටතේ ඇප ලබා නොදීමට මහේස්ත්‍රාත් විසින් සළකා බලා ඇත්තේ පැමිණිලිකරුගේ නීතිඥවරුන් ඉදිරිපත් කළ කරුණු ඉක්මවා පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කළ කරුණු වෙත ම අවධානය යොමු කිරීමෙන් බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විසින් හොරණ මහේස්ත්‍රාත් අධිකරණයේදී එකී නඩු කටයුත්තේ දී මහේස්ත්‍රාත් වරයා විසින් කටයුතු කර ඇති ආකාරය අනුව යම් අගතියක් සිදුව තිබේනම් ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කළ යුතු වන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවට බව ද මින් වාර්තා කරනු ලබන්නේ පරීක්ෂණ අවස්ථාවේ පැමිණිලිකරු ඒ සම්බන්ධව ද තම පැමිණිලිකරු අදාළව ඉදිරිපත් කළ ලේඛන තුළින් කරුණු දක්වා ඇති බැවිනි.

පැමිණිලිකරු විසින් පරිසර බලපත්‍රයේ සඳහන් කිසිදු කොන්දේසියක් උල්ලංඝනය කර නොතිබියදී බලපත්‍රය අවලංගු කර ඇති අතර එය නැවත යථාවත් කර දෙන ලෙස කළ අභියාචනා කිසිවක් සළකා බලා ඇති බවක් අනාවරණය නොවේ. නමුත් මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ ආරම්භ කළ පසු බලපත්‍රය කෙටි කලක් තුළ නැවත සක්‍රිය කර දීමට ක්‍රියා කර ඇති බව අනාවරණය වේ. 2009 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම කර්මාන්ත ශාලා හිමිකරුට එරෙහිව කළ අකටයුත්තකට එරෙහිව පෙත්සම්කරු විසින් අධිකරණයේ නඩුවක් පවරා තිබීම පැමිණිලිකරුගේ කර්මාන්ත ශාලාවට එරෙහිව ද්වේශ සහගතව කටයුතු කිරීමට හේතුවක් වූ බවට පැමිණිලිකරුට සැකයක් ද පවතින බව පෙන්වා දී ඇතත් ඊට හේතුව එයම ද යන්න පරීක්ෂණ අවස්ථාවේ අනාවරණය කර ගැනීම අපහසු විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ 2018.09.18 දින පැවති පරීක්ෂණ අවස්ථාවේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් දන්වා සිටියේ, පැමිණිලිකරු පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙත කළ අභියාචනය සළකා බලා බලපත්‍රය නැවත සක්‍රිය කිරීමට විරෝධතාවයක් නොමැති බවයි. එනම්, එම පරීක්ෂණ දින වනවිට මාස 05ක කාලයක් ගතවී ඇතත්, බලපත්‍රය සක්‍රිය නොකර අත්හිටුවා තබා තිබූ බව ඉන් නිරීක්ෂණය වේ. දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු මහතා විසින් සම්පූර්ණ පරීක්ෂණයක් කර්මාන්ත ශාලා ආඥා පනත යටතේ පවත්වා 2018.09.05 දින ලිඛිතවම වාර්තා කර ඇත්තේ කර්මාන්ත ශාලාව සක්‍රිය කිරීමට කිසිදු බාධාවක් නොමැති බව ද සියළු ආරක්ෂක ක්‍රමවේද සපුරා ඇති බව ද ය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ අවස්ථාවෙන් පසු කරුණු පැහැදිලි කර දීමෙන් අනතුරුව බලපත්‍රය අත්හිටුවා තිබීම අවසන් කර නැවත සක්‍රිය කළ ද ඒ වනවිට කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ක්‍රියාවලියට දැඩි අලාභයක් සිදුව අවසන් බව පෙන්වා දියයුතුය. එබැවින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම කර්මාන්ත ශාලාවේ බලපත්‍රය අත්හිටුවා ඇත්තේ කර්මාන්ත ශාලා හිමිකරු බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර නොතිබියදී බව පෙනී යයි. තවද මාස 03කට වරක් හා වාර්ෂිකව ද මෙම කර්මාන්ත ශාලාව කම්කරු දෙපාර්තමේන්තුවේ ද දිස්ත්‍රික් කර්මාන්ත ඉංජිනේරු වරයාගේ ද මධ්‍යම පරිසර අධිකාරියේ ද තවත් කර්මාන්ත ශාලා පරීක්ෂණ වලට අදාළ ආයතන ගණනාවක් විසින් ද පරීක්ෂාවට ලක් කරමින් වසර 25කට ආසන්න කාලයක් පවත්වාගෙන එන ලද කර්මාන්ත ශාලාවක් බව පරීක්ෂණ වලදී පැමිණිලිකරු විසින් කරුණු සහිතව පැහැදිලි කර දී තිබේ. මින් පෙර මෙම කර්මාන්ත ශාලාවේ සිදුවූ වෙනත් අනතුරු වාර්තා වී නොතිබුණද මධ්‍යම පරිසර අධිකාරිය විසින් දීර්ඝ කාලයක් කර්මාන්ත ශාලාවේ බලපත්‍රය මෙම අවස්ථාවේ අත්හිටුවා තිබීමට හේතු වූ කරුණු පැහැදිලි කර නැති බවද අනාවරණය වේ. 2018.06.25 දින පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් පරිසර අධිකාරිය අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත්තේ ද හදිසි අනතුරක් සිදුවූ පමණින්ම කිසියම් ආයතනයක බලපත්‍රය අත්හිටුවීම සාධාරණ නොවන බවය.

හොරණ පොලිසිය විසින් මෙම කර්මාන්ත ශාලාවේ සිදුවූ අනතුරු දායක සිදුවීමට අදාළව තම විමර්ශන පවත්වා අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී සෑම අවස්ථාවකදීම අනතුර යන වචනය වෙනුවට අපරාධය යන වචනය භාවිතා කරමින් කරුණු වාර්තා කර ඇති බව පැහැදිලි වේ. එමෙන්ම කර්මාන්ත ශාලාවේ ප්‍රධාන කළමණාකරු වන ජේ.කේ.ඩී.ආර්.එදිරිසිංහ සහ රසායනාගාර ශිල්පී ඉනෝකා සංජීවනී වැලිකල යන අය අත්අඩංගුවට ගෙන ඇත්තේ අධිකරණ නියෝගයකින් තොරව බව ද පෙනී යයි. හොරණ ප්‍රදේශයේම පිහිටි නාලක කඩදාසි නම් ආයතනයේ ටැංකි වළකට පුද්ගලයින් තිදෙනෙකු වැටී එක් පුද්ගලයෙකු මියගොස් ඇති බවට 2019.05.31 වන දින අනාවරණය වූ සිදුවීමකට අදාළව ඉංගිරිය පොලිසිය විසින් කටයුතු කර ක්‍රියා කරන ලද්දේ පළමුව අධිකරණයට කරුණු වාර්තා කර තවදුරටත් ඉදිරි පියවර ගැනීම බව ඊට අදාළ 47396/19 දරණ හොරණ අධිකරණයේ පැවති නඩුවේ කරුණු

පරීක්ෂා කර බැලීමේදී තිරීක්ෂණය වේ. ඒ අනුව හොරණ පොලිසිය විසින් අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී හා අත්අඩංගුවට ගෙන කටයුතු කර ඇති ආකාරය අනුව පැමිණිලිකරුගේ මෙන්ම කර්මාන්ත ශාලාවේ නිලධරයින් දෙදෙනෙකුගේ ද නිදහස අහිමි වන ආකාරයට ක්‍රියාවන් සිදුව ඇති බව ද නිරීක්ෂණය වේ. මෙම අත්අඩංගුවට ගැනීම අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමක් ලෙස සැලකිය හැකි අතර අධිකරණයට කරුණු වාර්තා කර අවශ්‍ය පියවර නොගෙන කරන ලද එකී ක්‍රියාවන් හේතුවෙන් 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 ව්‍යවස්ථාව උල්ලංඝනය වන ආකාරයට වගඋත්තරකාර හොරණ පොලිසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක, ප්‍ර.පො.ප. ප්‍රසන්න වැලිකල යන අය විසින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

**නිර්දේශය :**

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට එරෙහිව කටයුතු කර ඇති ආකාරය අනුව 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බව ද පහත පරිදි ක්‍රියා කළයුතු බවද මින් නිර්දේශ කරමු.

1. හොරණ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ලෙස කටයුතු කළ ප්‍ර.පො.ප. ප්‍රසන්න වැලිකල යන අය විසින් පදනම් විරහිතව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කරමින් ක්‍රියා කර ඇති ආකාරය අනුව පැමිණිලිකරු මූලික අයිතිවාසිකම් කඩවීමකට ලක්ව ඇති බවද පැමිණිලිකරුගේ කර්මාන්ත ශාලාවට එරෙහිව අධිකරණයට කරුණු ඉදිරිපත් කළ බී වාර්තාව ඉදිරිපත් කිරීමේදී ද 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 115 (1), (2), (3) හා 120(1) (2), යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සාධාරණ හා යුක්ති සහගත කරුණු ඉදිරිපත් නොකිරීමෙන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයට කටයුතු කර තිබීම පිළිබඳ පොලිස්පති විසින් විශේෂ විමර්ශනයක් සිදු කර අධිකරණයට ගොනු කර ඇති කරුණු අනුව දිගින් දිගටම පැමිණිලිකරුට අගතියක් සිදු වන්නේ නම් එය වැළැක්වීමට පියවර ගතයුතු බව ද මෙම වගඋත්තරකරු කටයුතු කර ඇති ආකාරය පිළිබඳ පොලිස්පති විසින් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු බවට ද මෙම වගඋත්තරකරු කටයුතු කර ඇති ආකාරය අනුව පැමිණිලිකරු මානසික හිංසනයකට ලක්ව තිබීම මත වගඋත්තරකරු විසින් පැමිණිලිකරුට රුපියල් දසදහසක (රු.10,000/-) වන්දි මුදලක් ගෙවීමට කටයුතු කළයුතු බවද

2. මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කර්මාන්ත ශාලාවේ පාරිසරික ආරක්ෂණ බලපත්‍රය පදනම් විරහිතව දීර්ඝ කාලයක් අක්‍රිය කර තිබීම තුළින් දැඩි මූල්‍යමය හානියක් සිදු වන ආකාරයට කටයුතු කර තිබීම පිළිබඳව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් විධිමත් පරීක්ෂණයක් සිදු කර ඊට අදාළව නෛතික ක්‍රියා මාර්ග ගතයුතු බව ද පැමිණිලිකරුට සිදුව ඇති මූල්‍යමය හානිය පූරණය කිරීමට ක්‍රියා කළයුතු බවද

3. කර්මාන්ත ආඥා පනත ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු විසින් සිදු කරන ලද පරීක්ෂණ වලට අදාළ නිර්දේශ නොසළකා හැර කර්මාන්ත ශාලාවට එරෙහිව කටයුතු කරන ලෙසට දිස්ත්‍රික් කර්මාන්ත ඉංජිනේරුවරයාට බලපෑම් සිදු කර තිබීම පිළිබඳව කම්කරු

කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් ඉදිරිපත් කරන ලද නිලධාරීන් විසින් එක්ව හෝ වෙන්වෙන්ව කටයුතු කර තිබීම පිළිබඳව කඩිනම් පරීක්ෂණයක් සිදු කර නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු බවද එකී නිලධාරීන් ද්වේශ සහගතව කටයුතු කරමින් අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කර තිබේනම් ඒ පිළිබඳ කම්කරු අමාත්‍යාංශයේ ලේකම් විසින් එකී නඩු පැවරීම තුළින් පැමිණිලිකරුට සිදුව ඇති යුක්ති සහගත නොවන ක්‍රියාමාර්ග වැලැක්වීමට ක්‍රියා කළයුතු බවද මින් නිර්දේශ කරමු.

**2022.02.25** වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර, ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මින් නිර්දේශ කරනු ලැබේ.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා

රෝහිණී මාරසිංහ,
සභාපති ( හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු )
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

සකස් කළේ : නී/නි. රතිල් අබේනායක.

දි/-ඩී/